# 6 ශ්‍රේණිය

# දෙවන බස සිංහල

## ගුරු මාර්ගෝපදේශය

(2015 වසරේ සිට ක්‍රියාත්මක වේ.)


සිංහල භාෂා දෙපාර්තමේන්තුව
ජාතික අධ්‍යාපන ආයතනය
ශ්‍රී ලංකාව

Web: www.nie.lk
Email: info@nie.lk

# දෙවන බස
# සිංහල
## ගුරු මාර්ගෝපදේශය

## 6 ශ්‍රේණිය
(2015  සිට ක්‍රියාත්මක වේ.)

සිංහල භාෂා දෙපාර්තමේන්තුව

ජාතික අධ්‍යාපන ආයතනය

ශ්‍රී ලංකාව

**දෙවන බස**
**සිංහල**

6 ශ්‍රේණිය

ගුරු මාර්ගෝපදේශය

ප්‍රථම මුද්‍රණය 2015

© ජාතික අධ්‍යාපන ආයතනය

ISBN :.....................

සිංහල භාෂා දෙපාර්තමේන්තුව
ජාතික අධ්‍යාපන ආයතනය
ශ්‍රී ලංකාව

**මුද්‍රණය :**

**මුද්‍රණාලය**
**ජාතික අධ්‍යාපන ආයතනය**

**වෙබ් අඩවිය :** www.nie.lk
**විද්‍යුත් තැපෑල :** info@nie.lk

# අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ පණිවිඩය

***ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව*** විසින් නිර්දේශ කරන ලද ජාතික මට්ටමේ නිපුණතා සංවර්ධනය කිරීමේ මූලික අරමුණ සහිත ව එවකට පැවති අන්තර්ගතය පදනම් වූ අධ්‍යාපනය වෙනුවට වර්ෂ අටකින් යුතු චක්‍රයකින් සමන්විත නව නිපුණතා පාදක විෂයමාලාවෙහි පළමු අදියර වර්ෂ 2007 දී ශ්‍රී ලංකාවේ ද්විතීයික අධ්‍යාපන ක්ෂේත්‍රයට හඳුන්වා දෙන ලදි.

නව විෂයමාලා චක්‍රයේ දෙවන අදියර 2015 වර්ෂයේ දී හය වන සහ දහ වන ශ්‍රේණි සඳහා හඳුන්වා දීම කළ යුතු ව තිබේ. මේ සඳහා පර්යේෂණවලින් අනාවරණය වූ කරුණු ද අධ්‍යාපනය පිළිබඳ ව අවධානය යොමු කරන විවිධ පාර්ශවයන්ගේ යෝජනා ද පදනම් කොට ගෙන විෂය නිර්දේශ තාර්කීකරණය කිරීමේ ක්‍රියාවලියක් ජාතික අධ්‍යාපන ආයතනය විසින් හඳුන්වා දෙනු ලැබීය.

මෙම තාර්කීකරණ ක්‍රියාවලියේ දී සියලු ම විෂයයන්ගේ නිපුණතා මට්ටම්, පදනම් මට්ටමේ සිට උසස් මට්ටම දක්වා ක්‍රමානුකූල ව ගොඩ නැගීම සඳහා පහළ සිට ඉහළට ගමන් කරන සිරස් සංකලනය භාවිත කරන ලදි. විවිධ විෂයයන්හි දී එක ම විෂය කරුණු නැවත නැවත ඉදිරිපත් වීම හැකිතාක් අවම කිරීම, වැඩි බර පැටවීම්වලින් යුක්ත විෂය අන්තර්ගතයන් අඩු කිරීම, සහ ක්‍රියාත්මක කළ හැකි ශිෂ්‍ය මිතුරු විෂයමාලාවක් සැකසීම සඳහා තිරස් සංකලනය භාවිත කර ඇත.

ගුරු භවතුන් සඳහා පාඩම් සැලසුම් කිරීම, ඉගැන්වීම, ක්‍රියාකාරකම් කර ගෙන යෑම, මැනීම් හා ඇගයීම් යනා දී අංශයන් සඳහා අවශ්‍ය වන්නා වූ මාර්ගෝපදේශයන් ලබාදීමේ අරමුණින් මෙම නව ගුරු මාර්ගෝපදේශය හඳුන්වා දී ඇත. පන්ති කාමරය තුළ දී වඩාත් ඵලදායී ගුරුවරයෙකු ලෙස කටයුතු කිරීමට මෙම මාර්ගෝපදේශයන් උපකාරී වනු ඇත. සිසුන්ගේ නිපුණතාවන් වර්ධනය කිරීම සඳහා ගුණාත්මක යෙදවුම් හා ක්‍රියාකාරකම් තෝරා ගැනීමට ගුරුවරුන්ට අවශ්‍ය නිදහස මෙමගින් ලබා දී තිබේ. එමෙන් ම නිර්දේශිත පාඨ ග්‍රන්ථවල ඇතුළත් වන විෂය කරුණු පිළිබඳ ව වැඩි බර තැබීමක් මෙම ගුරු මාර්ගෝපදේශවල අන්තර්ගත නොවේ. එම නිසා මෙම ගුරු මාර්ගෝපදේශය වඩාත් ඵලදායී වීමට නම් අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව විසින් සකසා ඇති අදාළ පාඨ ග්‍රන්ථ සමග සමගාමී ව භාවිත කිරීම අත්‍යවශ්‍ය වේ.

තාර්කීකරණය කරන ලද විෂය නිර්දේශ, නව ගුරු මාර්ගෝපදේශ හා අලුතින් සංවර්ධනය කර ඇති පාඨ ග්‍රන්ථවල මූලික අරමුණු වන්නේ ගුරු කේන්ද්‍රීය අධ්‍යාපන රටාවෙන් සිසු කේන්ද්‍රීය අධ්‍යාපන රටාවක් හා වඩාත් ක්‍රියාකාරකම් මත පදනම් වූ අධ්‍යාපන රටාවකට වෙනස්වීම මගින් වැඩ ලෝකයට අවශ්‍ය වන්නා වූ නිපුණතා හා කුසලතාවන්ගෙන් යුක්ත මානව සම්පතක් බවට ශිෂ්‍ය ප්‍රජාව සංවර්ධනය කිරීමයි.

මෙම ගුරු මාර්ගෝපදේශ සම්පාදනය කිරීමේ දී ජාතික අධ්‍යාපන ආයතනයේ ශාස්ත්‍රීය කටයුතු මණ්ඩලය ද ආයතනයේ සභාව ද නන් අයුරින් දායකත්වය ලබා දුන් සියලු ම සම්පත්දායකයින් හා අනිකුත් පාර්ශවයන්ගේ ඉමහත් කැපවීම ඇගැයීමට ද මෙය අවස්ථාවක් කර ගනු කැමැත්තෙමි.

අධ්‍යක්ෂ ජනරාල්
ජාතික අධ්‍යාපන ආයතනය

# නියෝජ්‍ය  අධ්‍යක්ෂ ජනරාල් හිමිගේ පණිවිඩය

ඉගෙනුම, පුළුල් ක්ෂේත්‍රයක විහිද යන්නකි.  එය ජීවිත අතිමහත් බවට ද, ඉතා ම සරල බවට ද පත්කරයි.  මනුෂ්‍යයා ඉගෙනුම් කුසලතාවෙන් උත්කෘෂ්ට ය.   මානව සමාජ සංවර්ධනය කේන්ද්‍ර  කොට ගත් රටක්, සමාජයක් බුද්ධිය විසින් හඳුනා ගත් අසම්මතයන් බැහැර කිරීමට ද සුභාවිතයන් තුළින් නව ලොවක් නිර්මාණය කර ගැනීමට ද මෙවලම කර ගනු ලබන්නේ ඉගෙනුම යි.

ඉගෙනුම සඳහා වටිනා යමක් ද, ඉගෙනුම් ක්‍රමවේදයන් හා පහසුකම් ද අධ්‍යාපනය වටා නිර්මාණය විය යුතු ය.  විෂය මාලාව, විෂය නිර්දේශ, මාර්ගෝපදේශ, සුසාධ්‍යකරුවන් ඉගෙනුම් ක්ෂේත්‍රයට එක් වනුයේ මේ ආකාරයෙනි.

නූතන ශ්‍රී ලංකාව ගෝලීය ප්‍රවණතාවන් මෙන් ම පුරාතන උරුමයන් ද සම්මිශ්‍රණය කර ගනිමින් ස්වීය අධ්‍යාපන රටාවක් හිමි කර ගෙන ඇත.  කාලීන අවශ්‍යතා මත ප්‍රතිසංස්කරණයන් තුළින් වසර අටකට වරක් යාවත්කාලීන වන විෂය මාලාවේ ඉගෙනුම් සම්පතක් ලෙස මෙම ගුරු මාර්ගෝපදේශ නිර්මාණය වේ.

විෂයයෙහි අරමුණුවල සංගතතාව ජාතික මට්ටමින් පවත්වා ගත යුතු ය.  එහෙත් ගුරු මාර්ගෝපදේශයන්හි  ඉගෙනුම් ක්‍රමවේදයන්, අකුරක්වත් වෙනස් නො කොට පිළිපැදිය යුත්තක් නම් නො වේ.  විෂය නිර්දේශයෙහි නිපුණතා, නිපුණතා මට්ටම්, සාධනය වීම සඳහා විෂය අන්තර්ගතය තුළින් ඉගෙනුම් පල සම්ප්‍රාප්තිය පිණිස ඉගෙනුම් ක්‍රමවේද නිර්මාණශීලී ව වෙනස් කර ගැනීමට සුසාධ්‍යකරුවන්ට පැහැදිලිව ම ඉඩක් ඇති බව සඳහන් කරමි.  ශිෂ්‍ය සාධන ප්‍රතිශතය ඉහළ මට්ටමකට ගැනීම සඳහා උදව් වන, පහසුකම් සලසන ගුරු භූමිකාවට කිසියම් ප්‍රවේශයක් සඳහා නිර්මාණය වන ගුරු මාර්ගෝපදේශ ශික්ෂකයාහට ද දෙගුරුනට ද භාවිත කළ හැකි ය.  අදාළ පෙළ පොතට සහකරුවකු වන ගුරු මාර්ගෝපදේශය තවත් පෙළ පොතක් නො වන බව දැන ගුරුභවතුන් ගුරු මාර්ගෝපදේශ හා අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුවේ සම්පාදිත අදාළ පෙළ පොත යන සම්පත් ද්‍රව්‍ය දෙක ම භාවිත කළ යුතු ය.

ඒ ඒ විෂයයන්හි සාධනය පිළිබඳ ඇගැයීම් සිදු කරන ජාතික මට්ටමේ පරීක්ෂකවරයෙකු වුව ද අපේක්ෂා කරන සාධනයන්, විෂය ඉගැන්වීමට මග පෙන් වන සුසාධ්‍යකරුවන් විසින් පාඩම අවසානයෙහි පන්ති කාමරයේ  දී දරුවන් සමග ප්‍රත්‍යක්ෂකරණයට පත් විය යුතු ය.  එම ඒකාත්මික වීම සඳහා වූ ප්‍රබෝධාත්මක සංස්කෘතියක් ගොඩනගා ගැනීමට ගුරු මාර්ගෝපදේශය පහුරක්, යාත්‍රාවක් කර ගනු ඇතැයි ආයාචනා පූර්වක ව අපේක්ෂා කරමි.

**පීඨාධිපති, නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්**
**භාෂා මානව ශාස්ත්‍ර හා සමාජවිද්‍යා පීඨය**
**ජාතික අධ්‍යාපන ආයතනය.**

## විෂය මාලා කමිටුව

**උපදේශකත්වය හා අනුමැතිය** : ශාස්ත්‍රීය කටයුතු මණ්ඩලය
ජාතික අධ්‍යාපන ආයතනය

**විෂය සම්බන්ධීකරණය** : මංගල ගුණරත්න මහතා - සහකාර කථිකාචාර්ය

**විෂය කමිටුව** :

මහාචාර්ය රත්න විජේතුංග මහතා (විශ්‍රාමික) - ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය
මහාචාර්ය තිස්ස ජයවර්ධන මහතා (විශ්‍රාමික) - කොළඹ විශ්ව විද්‍යාලය
පේමසිරි සුබසිංහ මහතා - ජ්‍යෙෂ්ඨ අධ්‍යාපනඥ
ඊ. ආර්. නිමල් ප්‍රේමකුමාර මහතා - කථිකාචාර්ය
කේ. ඤාණවිමල හිමි - කථිකාචාර්ය
එම්. ජී. මුණසිංහ මහතා - කථිකාචාර්ය
තිලිනි රත්නායක මහත්මිය - කථිකාචාර්ය
මංගල ගුණරත්න මහතා - සහකාර කථිකාචාර්ය
පී. ඒ. ඩී. රුවනි සිසිජා මහත්මිය - සහකාර කථිකාචාර්ය
පී. වී. සෙල්වරාජ් මහතා - විද්‍යාපීඨ කථිකාචාර්ය, (විශ්‍රාමික)
එච්. එල්. හරිස්චන්ද්‍ර මහතා - සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ
සුජාතා උපසේන මහත්මිය - ගුරු උපදේශක
අනීෂා ඉනාම් ඕෂන් මහත්මිය - ගුරු උපදේශක
ඒ. එච්. ෆාතිමා බීබී මහත්මිය - ගුරු උපදේශක
ධම්මිකා කරල්ලියද්ද මෙනවිය - ගුරු සේවය
තේජා ඇරැගොඩ මහත්මිය - ගුරු සේවය
එම්. එච්. ඒ. සජීවනී මහත්මිය - ගුරු සේවය

**ලේඛක මණ්ඩලය** :

**අභ්‍යන්තර :**

ඊ. ආර්. නිමල් ප්‍රේමකුමාර මහතා - කථිකාචාර්ය, ජාතික අධ්‍යාපන ආයතනය
කේ. ඤාණවිමල හිමි - කථිකාචාර්ය, ජාතික අධ්‍යාපන ආයතනය
එම්. ජී. මුණසිංහ මහතා - කථිකාචාර්ය, ජාතික අධ්‍යාපන ආයතනය
තිලිනි රත්නායක මහත්මිය - කථිකාචාර්ය, ජාතික අධ්‍යාපන ආයතනය
මංගල ගුණරත්න මහතා - සහකාර කථිකාචාර්ය, ජාතික අධ්‍යාපන ආයතනය
පී. ඒ. ඩී. රුවනි සිසිජා මහත්මිය - සහකාර කථිකාචාර්ය, ජාතික අධ්‍යාපන ආයතනය

**බාහිර :**

| | | |
|---|---|---|
| ආර්. ඒ. සුනීකා මහත්මිය | - | නියෝජ්‍ය කොමසාරිස් (විශ්‍රාමික) |
| පී. වී. සෙල්වරාජ් මහතා | - | විද්‍යාපීඨ කථිකාචාර්ය, (විශ්‍රාමික) |
| එච්. එල්. හරිස්චන්ද්‍ර මහතා | - | සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ |
| ආර්. එම්. ජේ. ඩී. කුමාර මහතා | - | සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ |
| ධම්මිකා කරල්ලියද්ද මෙනවිය | - | ගුරු සේවය |

**භාෂා සංස්කරණය** : සිංහල භාෂා දෙපාර්තමේන්තුව, ජාතික අධ්‍යාපන ආයතනය

**විවිධ සහාය** :
අනුලා නන්දනී රාජපක්ෂ මහත්මිය
චාමිනි මානවඩු මහත්මිය
නිලූපා අබේරත්න මහත්මිය
උපාලි ජයලත් මහතා

# ගුරු මාර්ගෝපදේශය පරිශීලනය සඳහා උපදෙස්

ගුරු මාර්ගෝපදේශය ගුරුවරයාගේ ඉගැන්වීම් ක්‍රියාවලියෙහි ඵලදායීතාව වැඩි කිරීම සඳහා මග පෙන් වනු ලබයි. ගුරුවරයාට වඩාත් පහසුවෙන් නිපුණතාවත්, නිපුණතා මට්ටමටත්, ඊට අදාළ පාඩමත් හඳුනා ගෙන ඉගැන්වීම් කාර්යයයේ නියැලීමට ඉඩ සැලසේ. ඒ සඳහා අවශ්‍ය ක්‍රමවේද, උපකරණ අමතර ක්‍රියාකාරකම් මෙහි අන්තර්ගත ව ඇත.

විශේෂයෙන් ම **සවන් දීම, කථනය, කියවීම, ලිවීම** යන චතුර්විධ භාෂා කුසලතා වර්ධනය මූලික වශයෙන් අපේක්ෂා කෙරේ. මෙහි දී භාෂණය කෙරෙහි වැඩි අවධානයක් යොමු කරමින් භාෂා හැකියා පුළුල් කිරීම සඳහා අවස්ථාව සලසා දී ඇත.

මෙහි **මූලික වදන්** මගින් පෙළ පොතේ පාඩමට අදාළ වාක් කෝෂය පෝෂණය කිරීමට වැඩි අවකාශයක් ලබා දී ඇත. ඒ සඳහා දරුවන්ගේ භාෂණ හැකියාව සංවර්ධනය කිරීමට **පුහුණුව** සඳහා යොදා ගත යුතු භාෂණ රටා ඇතුළත් කර තිබේ. ඒවා හැකිතාක් භාවිත කරමින් පන්ති කාමරයේ දී ශිෂ්‍යයන් කතා කරවීමට පෙලඹ විය යුතු ය. ඊට අදාළ ක්‍රියාකාරකම්හි වැඩි වැඩියෙන් නිරත කරවීම සඳහා ඔබගේ අත්දැකීම් ද පාදක කර ගනිමින් පන්ති කාමරයේ සිටින ශිෂ්‍යයන්ගේ මට්ටමට ගැළපෙන අයුරින් මෙම ක්‍රමවේද තවත් සරල කර ගනිමින් අවශ්‍ය අවස්ථාවල දී සංයුක්ත තැටි, හඬ පට, ගීත, ඡායාරූප, පින්තූර ආදි වඩාත් උචිත ක්‍රමවේද යොදා ගත හැකි ය. එසේ ම පාඩම් සැලසුම් සඳහා ලබා දී ඇති උපදෙස් ද සැලකිල්ලට ගෙන වඩාත් ආකර්ෂණීය ලෙස පාඩම් සැලසුම් කිරීමට ගුරුවරයාට අවස්ථාව සැලසෙනු ඇත.

මෙහි ඇති වඩාත් සුවිශේෂ කරුණ වන්නේ අදාළ පාඩම අවසානයේ ශිෂ්‍යයා අත් පත් කර ගත යුතු දේ ඉගෙනුම් පල ලෙස දක්වා තිබීමයි. එම කුසලතා ශිෂ්‍යයන්ගෙන් මතු කර ගැනීමට නිරතුරුව ම ඔබ වගබලා ගත යුතු ය. ඇගයීම් හා තක්සේරුකරණය සඳහා ලබා දී ඇති නිර්ණායක මගින් ශිෂ්‍යයන්ගේ ප්‍රබලතා හා දුබලතා හඳුනා ගෙන ඉදිරි පෝෂණ හා ප්‍රතිපෝෂණ ක්‍රියාකාරකම් සැලසුම් කිරීමට හැකියාව ලැබේ. මෙම ගුරු මාර්ගෝපදේශය පරිශිලනය කරමින් ඔබේ අත්දැකීම ද ඒ සඳහා සුදුසු පරිදි යොදා ගෙන පන්ති කාමරයේ ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සාර්ථක කර ගැනීමට මෙය මහෝපකාරී වනු ඇතැයි උදක් ම අපේක්ෂා කරමු.

ලේඛක මණ්ඩලය

# පටුන


| | පිටුව |
|---|---|
| අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ පණිවිඩය | iii |
| නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්හිමිගේ පණිවිඩය | iv |
| විෂයමාලා කමිටුව | v - vi |
| ගුරු මාර්ගෝපදේශය පරිශීලනය කිරීම සඳහා උපදෙස් | vii |
| හැඳින්වීම | ix |
| ජාතික අරමුණු | x-xi |
| මූලික නිපුණතා | xii-xiii |
| විෂයයේ අරමුණු | xiv |
| විෂය නිර්දේශයේ අන්තර්ගතය | xv - xxiii |
| ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා උපදෙස් | 01 |
| 1. සවන්දීම | 02 - 15 |
| 2. කථනය | 16 - 36 |
| 3. කියවීම හා නැරඹීම | 37 - 48 |
| 4. ලිවීම | 49 - 52 |

# හැඳින්වීම

සමාජය නොකැඩී නොබිඳී පවතින්නේ පුද්ගලයන් අතර පවතින හොඳහිත සහ සුහදතාව නිසා ය. එබැවින් සමාජය නොකැඩෙන සේ නොබිඳෙන සේ පවත්වා ගැනීමේ අරමුණ සාමාජිකයන් අතර දැඩි ලෙස පැවතිය යුතු ය. මෙම අරමුණ මුදුන් පමුණුවා ගැනීමට මූලාධාර වන්නේ මනුෂ්‍යයා සමාජ ගත වීම සඳහා යොදා ගන්නා ප්‍රබලතම උපකරණය වන භාෂාව යි.

ශ්‍රී ලංකාවේ පවතින භාෂා ප්‍රතිපත්තිය අනුව ප්‍රාථමික අවධියේ සිට සිංහල/දමිළ භාෂා දෙකින් එක් භාෂාවක් දෙවන බස ලෙස හැදෑරීම අනිවාර්ය ව පවතී. තම අනන්‍යතාව ආරක්ෂා කර ගනිමින් ජාතියක් වශයෙන් භාෂා ප්‍රජාවක් ලෙස කටයුතු කිරීම මගින් සාධනීය ආකල්ප ගොඩනගා ගැනීමට මෙහි දී අවස්ථාව උදා කර දී ඇත. එය යථාර්ථයක් බවට පත් කරමින් භාෂාවක් භාවිත කිරීමට පුද්ගලයා සතු දෙයාකාර භාෂා ශක්‍යතා අතරින් භාෂණ ශක්‍යතාවට ප්‍රමුඛතාව දෙමින් 6 ශ්‍රේණියේ සිට 11 ශ්‍රේණිය දක්වා දෙවන බස සිංහල විෂයමාලාව සැලසුම් කොට ඇත.

මේ සම්බන්ධයෙන් පසුගිය විෂයමාලා ප්‍රතිසංස්කරණ හා ඒ අනුසාරයෙන් සැකසුණු පන්ති කාමර ක්‍රියාවලිය පිළිබඳ සිදු කළ පර්යේෂණ අනාවරණයන් ද ලොව විවිධ රටවල භාවිත කෙරෙන බොහොමයක් විෂය නිර්දේශ ද අධ්‍යයනය කරන්නට යෙදුණි. එහි දී නොයෙක් පාර්ශවයන්ගේ අවධානයට බඳුන් වූ **"පොදු යුරෝපියානු ආදර්ශනය"** (The Common European Framework of Reference for Languages (CEFR) කෙරෙහි සැලකිල්ල යොමු විය. **එහි හරය සහ ආකෘතික රාමුව** ගැන විශේෂ යොමු වීමක් සිදු විය. එහි දී දැනට අප භාවිත කරන නිපුණතා ප්‍රවේශයට උදව් වන ලෙස හෙළ බසේ ගති සොබා හා හැඩරුව කෙරෙහි විශේෂත්වයක් දක්වමින් දෙවන බස සිංහල විෂයමාලාව සකසා ඇත.

# ජාතික අරමුණු

පුද්ගලයාට හා සමාජයට අදාළ වන ප්‍රධාන ජාතික අරමුණු කරා ළඟා වීම සඳහා පුද්ගලයින්ට සහ කණ්ඩායම්වලට ජාතික අධ්‍යාපන පද්ධතියට සහාය විය යුතු ය.

වසර ගණනාවක් මුළුල්ලේ ශ්‍රී ලංකාවේ ප්‍රධාන අධ්‍යාපන වාර්තා සහ ලේඛන මගින් පුද්ගල හා ජාතික අවශ්‍යතාවන් සපුරාලීම සඳහා අරමුණු නියම කරනු ලැබීය. සමකාලීන අධ්‍යාපන ව්‍යුහයන් හා ක්‍රියාවලින් තුළ දැකිය හැකි දුර්වලතා නිසා ධරණීය මානව සංවර්ධන සංකල්ප රාමුව ඇතුළත අධ්‍යාපනය තුළින් ළඟා කර ගත යුතු පහත දැක්වෙන අරමුණු ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් හඳුනා ගෙන ඇත. මෙම අරමුණු සපුරා ගැනීම, අධ්‍යාපන පද්ධතිය සඳහා වූ තම ඉදිරි දැක්ම ලෙසට ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් ප්‍රත්‍යක්ෂ කොට ගෙන ඇත.

I. මානව අභිමානයට ගරු කිරීමේ සංකල්පයක් මත පිහිටා ශ්‍රී ලාංකික බහුවිධ සමාජයේ සංස්කෘතික විවිධත්වය අවබෝධ කර ගනිමින් ජාතික ඒකාබද්ධතාව, ජාතික ඍජු ගුණය, ජාතික සමගිය, එකමුතුකම සහ සාමය ප්‍රවර්ධනය කිරීම තුළින් ජාතිය ගොඩනැගීම සහ ශ්‍රී ලාංකේය අනන්‍යතාව තහවුරු කිරීම.

II. වෙනස් වන ලෝකයක අභියෝගයන්ට ප්‍රතිචාර දක්වන අතර ජාතික උරුමයේ මාහැඟි දායාදයන් හඳුනා ගැනීම සහ සංරක්ෂණය කිරීම.

III. මානව අයිතිවාසිකම්වලට ගරු කිරීම, යුතුකම් හා වගකීම් පිළිබඳ දැනුවත් වීම, හෘදයංගම බැඳීමකින් යුතු ව එකිනෙකා කෙරෙහි සැලකිලිමත් වීම යන ගුණාංග ප්‍රවර්ධනය කිරීමට ඉවහල් වන සමාජ සාධාරණත්ව සම්මතයන් සහ ප්‍රජාතාන්ත්‍රික ජීවන රටාවක් ගැබ් වූ පරිසරයක් නිර්මාණ කිරීම සහ පවත්වා ගෙන යාමට සහාය වීම.

IV. පුද්ගලයින්ගේ මානසික හා ශාරීරික සුව සම්පත සහ මානව අගයයන්ට ගරු කිරීම මත පදනම් වූ තිරසාර ජීවන ක්‍රමයක් ප්‍රවර්ධනය කිරීම.

V. සුසමාහිත වූ සමබර පෞරුෂයක් සඳහා නිර්මාපණ හැකියාව, ආරම්භක ශක්තිය, විචාරශීලී චින්තනය, වගකීම හා වගවීම ඇතුළු වෙනත් ධනාත්මක අංග ලක්ෂණ සංවර්ධනය කිරීම.

VI පුද්ගලයාගේ සහ ජාතියේ ජීවගුණය වැඩි දියුණු කෙරෙන සහ ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනය සඳහා දායක වන ඵලදායි කාර්යයන් සඳහා අධ්‍යාපනය තුළින් මානව සම්පත් සංවර්ධනය කිරීම.

VII ශීඝ්‍රයෙන් වෙනස් වන ලෝකයක් තුළ සිදු වන වෙනස්කම් අනුව හැඩ ගැසීමට හා ඒවා පාලනය කර ගැනීමට පුද්ගලයින් සූදානම් කිරීම සහ සංකීර්ණ හා අනපේක්ෂිත අවස්ථාවන්ට සාර්ථක ව මුහුණ දීමේ හැකියාව වර්ධනය කිරීම.

VIII ජාත්‍යන්තර ප්‍රජාව අතර ගෞරවනීය ස්ථානයක් හිමි කර ගැනීමට දායක වන යුක්තිය, සමානත්වය සහ අන්‍යෝන්‍ය ගරුත්වය මත පදනම් වූ ආකල්ප හා කුසලතා පෝෂණය කිරීම.

(ජාතික අධ්‍යාපන කොමිෂන් සභා වාර්තාව - 2003 දෙසැම්බර්)

# මූලික නිපුණතා

අධ්‍යාපනය තුළින් වර්ධනය කෙරෙන පහත දැක්වෙන මූලික නිපුණතා ඉහත සඳහන් ජාතික අරමුණු මුදුන් පත් කර ගැනීමට දායක වනු ඇත.

(I) සන්නිවේදන නිපුණතා

සාක්ෂරතාව, සංඛ්‍යා පිළිබඳ දැනුම, රූපක භාවිතය සහ තොරතුරු තාක්ෂණ ප්‍රවීණත්වය යන අනුකාණ්ඩ 4ක් මත සන්නිවේදන නිපුණතා පදනම් වේ.

සාක්ෂරතාව : සාවධාන ව ඇහුම්කන් දීම පැහැදිලි ව කථා කිරීම, තේරුම් ගැනීම සඳහා කියවීම, නිවැරදි ව සහ නිරවුල් ව ලිවීම, ඵලදායි අයුරින් අදහස් හුවමාරු කර ගැනීම.

සංඛ්‍යා පිළිබඳ දැනුම : භාණ්ඩ අවකාශය හා කාලය ගණන් කිරීම, ගණනය සහ මිනුම් සඳහා ක්‍රමානුකූල ඉලක්කම් භාවිතය.

රූපක භාවිතය : රේඛා සහ ආකෘති භාවිතයෙන් අදහස් පිළිබිඹු කිරීම සහ රේඛා, ආකෘති සහ වර්ණ ගළපමින් විස්තර, උපදෙස් හා අදහස් ප්‍රකාශනය හා වාර්තා කිරීම.

තොරතුරු තාක්ෂණ ප්‍රවීණතාව: පරිගණක දැනුම සහ ඉගෙනීමේ දී ද සේවා පරිශ්‍රයන් තුළ දී ද පෞද්ගලික ජීවිතයේ දී ද තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය උපයෝගී කර ගැනීම.

(II) පෞරුෂත්ව වර්ධනයට අදාළ නිපුණතා

- නිර්මාණශීලී බව, අපසාරී චින්තනය, ආරම්භක ශක්තිය, තීරණ ගැනීම, ගැටලු නිරාකරණය කිරීම, විචාරශීලී හා විග්‍රහාත්මක චින්තනය, කණ්ඩායම් හැඟීමෙන් කටයුතු කිරීම, පුද්ගලාන්තර සබඳතා, නව සොයා ගැනීම් සහ ගවේෂණය වැනි වර්ගීය කුසලතා.

- ඍජු ගුණය, ඉවසා දරා සිටීමේ ශක්තිය සහ මානව අභිමානයට ගරු කිරීම, වැනි අගයයන්.

- චිත්තවේගී බුද්ධිය.

(III) පරිසරයට අදාළ නිපුණතා
මෙම නිපුණතා සාමාජික, ජෛව සහ භෞතික පරිසරයන්ට අදාළ වේ.

සමාජ පරිසරය : ජාතික උරුමයන් පිළිබඳ අවබෝධය, බහුවාර්ගික සමාජයක සමාජිකයන් වීම හා සම්බන්ධ සංවේදීතාව හා කුසලතා, සාධාරණ යුක්තිය පිළිබඳ හැඟීම, සමාජ සම්බන්ධතා, පෞද්ගලික චර්යාව, සාමාන්‍ය හා නෛතික සම්ප්‍රදායයන්,අයිතිවාසිකම්, වගකීම්, යුතුකම් සහ බැඳීම්.

ජෛව පරිසරය : සජීව ලෝකයක, ජනතාව සහ ජෛව පද්ධතිය, ගස් වැල්, වනාන්තර, මුහුදු ජලය, වාතය සහ ජීවය - ශාක, සත්ත්ව හා මිනිස් ජීවිතයට සම්බන්ධ වූ අවබෝධය, සංවේදී බව හා කුසලතා.

භෞතික පරිසරය : අවකාශය, ශක්තිය, ඉන්ධන, ද්‍රව්‍ය, භාණ්ඩ සහ මිනිස් ජීවිතයට එවායේ ඇති සම්බන්ධතාව, ආහාර, ඇඳුම්, නිවාස, සෞඛ්‍ය, සුව පහසුව, ශ්වසනය, නින්ද, නිස්කලංකය, විවේකය, අපද්‍රව්‍ය සහ මලපහ කිරීම යනාදිය හා සම්බන්ධ වූ අවබෝධය, සංවේදිතාව හා කුසලතාව

ඉගෙනීම, වැඩ කිරීම සහ ජීවත් වීම සඳහා මෙවලම් සහ තාක්ෂණය ප්‍රයෝජනයට ගැනීමේ කුසලතා මෙහි අඩංගුවේ.

(IV) වැඩ ලෝකයට සූදානම් වීමේ නිපුණතා

ආර්ථික සංවර්ධනයට දායක වීම.
තම වෘත්තීය ළැදියා සහ අභියෝග්‍යතා හඳුනා ගැනීම.
හැකියාවන්ට සරිලන අයුරින් රැකියාවක් තෝරා ගැනීම සහ
වාසිදායක හා තිරසාර ජීවනෝපායක නිරත වීම,
යන හැකියාවන් උපරිම කිරීමට හා ධාරිතාව වැඩි කිරීමට අදාළ සේවා නියුක්තිය හා සම්බන්ධ කුසලතා.

(V) ආගම සහ ආචාර ධර්මයන්ට අදාළ නිපුණතා

පුද්ගලයන්ට තම දෛනික ජීවිතයේ දී ආචාර ධර්ම, සදාචාරාත්මක හා ආගමානුකූල හැසිරීම් රටාවන්ට අනුගත වෙමින් වඩාත් උචිත දේ තෝරා එයට සරිලන සේ කටයුතු කිරීම සඳහා අගයයන් උකහා ගැනීම හා ස්වීයකරණය.

(VI) ක්‍රීඩාව සහ විවේකය ප්‍රයෝජනයට ගැනීමේ නිපුණතා

සෞන්දර්යය, සාහිත්‍යය, සෙල්ලම් කිරීම, ක්‍රීඩා හා මලල ක්‍රීඩා, විනෝදාංශ හා වෙනත් නිර්මාණාත්මක ජීවන රටාවන් තුළින් ප්‍රකාශ වන විනෝදය, සතුට, ආවේග සහ එවන් මානුෂික අත්දැකීම්.

(VII) "ඉගෙනීමට ඉගෙනුම" පිළිබඳ නිපුණතා

ශීඝ්‍රයෙන් වෙනස් වන සංකීර්ණ හා එකිනෙකා මත යැපෙන ලෝකයක පරිවර්තන ක්‍රියාවලියක් හරහා වෙනස්වීම් හසුරුවා ගැනීමේ දී හා ඊට සංවේදී ව හා සාර්ථක ව ප්‍රතිචාර දැක්වීමත් ස්වාධීන ව ඉගෙන ගැනීමත් සඳහා පුද්ගලයන්ට ශක්තිය ලබා දීම.

## විෂයයේ අරමුණු

1. **ශබ්ද උච්චාරණ රටා**
   ශබ්ද උච්චාරණ රටා, ශ්‍රවණ අත්දැකීම් සහ භාෂා රටා අනුකරණාත්මක ව හැසිරවීමේ හුරුව ඇති කර ගැනීම.

2. **ශ්‍රවණ සංයමය හා අවධානය**
   විවිධතා හඳුනා ගනිමින් අවබෝධයෙන් යුතු ව ප්‍රකාශ කිරීමේ ශක්තිය ඇති කර ගැනීම.

3. **ස්මරණය**
   මතකය අවධි කර ගනිමින් අලුත් යමක් නිපදවීමේ ශක්තීන් ගොඩනගා ගැනීම.

4. **වින්දනය හා සුහදතාව**
   අසා රස විඳිමින් ප්‍රසන්න සහ සුන්දර සිතිවිලි මඟින් මානව දයාව, සුහදතාව ගොඩනැගීම.

5. **භාවිත රටා හුරුව**
   භාෂා රීතිවලට අනුගත ව භාෂාව භාවිත කිරීමේ හුරුව සහ සිංහල අත් අකුරු නිවැරදි ව, ක්‍රමවත් ව, පැහැදිලි ව ලිවීමේ හුරුව ඇති කර ගැනීම.

6. **වාක්කෝෂ හැකියාව**
   බස්වහර හඳුනා ගනිමින් අන්තර්ගත වචන රැස් කරමින් ඒවා සුදුසු ලෙස භාවිත කිරීමේ හුරුව ඇති කර ගැනීම.

7. **ආකල්ප ගොඩනැගීම**
   උත්සව අවස්ථා, සිරිත් විරිත්, පරිභෝජන රටා, ගණන් මිනුම් පිළිබඳ හෙළබසේ ගති සොබා අනුව සිංහල සංස්කෘතියෙහි හැඩරුව හඳුනා ගනිමින් සමාජ සම්බන්ධතා ශක්තිමත් කර ගැනීමට දායක වීම.

8. **විෂය නිර්දේශයේ අරමුණු**
   - විවිධ ප්‍රායෝගික කාර්යයන් ඉටුකර ගැනීම සඳහා භාෂා සම්මතයන්ට (රීති) අනුව භාෂා භාවිතය පිළිබඳ ව හුරුව ලබා ගැනීම.
   - සංස්කෘතිය හා සංස්කෘතික උරුමයන්, දායාද, වටිනාකම් හා අගයයන් පිළිබඳ දැනුම හා අවබෝධය ඇති කර ගනිමින් අභිමානවත් ශ්‍රී ලාංකේය ජාතියක් ගොඩනැගීම සඳහා යහපත් ආකල්ප හා පුරුදු සංවර්ධනය කර ගැනීම.
   - පුරවැසියෙකු ලෙස සියලු ප්‍රතිලාභ අත්විඳීම උදෙසා දේශීය වශයෙන් වෘත්තීය ප්‍රස්තාවන් සඵල කර ගැනීම සඳහා භාෂා ප්‍රවීණතාවක් ඇති කර ගැනීම.

**විෂය නිර්දේශය - 6 ශ්‍රේණිය**

**සවන් දීම**

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද සංඛ්‍යාව |
|---|---|---|---|---|
| 1.0<br>එදිනෙදා පොදු අවස්ථා හා සිදු විය හැකි අවස්ථා පිළිබඳ සමීප බස්වහරකින් මැනවින් ගළපා සැකසූ පාඨවලට (Texts) සවන් දෙමින්, ප්‍රතිචාර දක්වමින් හඳුනා ගනියි. තේරුම් ගනියි. | 1.1<br>සුහද කතාබහට සවන් දෙයි. ප්‍රතිචාර දක්වයි. | • වැඩට ගිය පියා නිවසට පැමිණීම | • අලුත් වචන හඳුනා ගෙන භාවිත කරයි.<br>• අවස්ථාවට ගැළපෙන සේ ප්‍රතිචාර දක්වයි.<br>• සුහද කතාබහේ යෙදෙයි. | 04 |
| | 1.2<br>උපදෙස්වලට සවන් දෙයි. ප්‍රතිචාර දක්වයි. | • නිවසේ දී ලැබෙන අර්ථවත් උපදෙස් ඃ | • උපදෙස් සහිත වචන හඳුනා ගෙන ප්‍රකාශ කරයි.<br>• උපදෙස්වලට ප්‍රතිචාර දක්වයි.<br>• උපදෙස් අනුව කටයුතු කරයි. | 04 |

| සවන් දීම | | | | |
|---|---|---|---|---|
| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද සංඛ්‍යාව |
| | 1.3<br>යමක් පිළිබඳ විමසීම්වලට හා මග විමසුම්වලට සවන් දෙයි. ප්‍රතිචාර දක්වයි. | • ගෙදර පරිසරයෙන් යමක්/යමෙක් සෙවීම. (පූස් පැටියා නැති වී සෙවීම) | • විමසීම් අවස්ථාව තේරුම් ගෙන ප්‍රකාශ කරයි.<br>• තොරතුරු අනුව යමක් සොයා ගනියි.<br>• සවන් දුන් විමසීම් අනුව නිවැරදි ව කටයුතු කරයි. | 03 |
| | 1.4<br>නිවේදනවලට සවන් දෙයි. ප්‍රතිචාර දක්වයි. | • නිවැසියන් දුම්රියෙන් ගමනක් යාම. | • සවන් දුන් නිවේදනයේ ඇතුළත් තොරතුරු කියයි.<br>• සවන් දුන් නිවේදනයට අනුව කටයුතු කරයි. | 04 |

| සවන් දීම | | | | |
|---|---|---|---|---|
| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද සංඛ්‍යාව |
| | 1.5<br>ගුවන්විදුලි ප්‍රචාර හා පටිගත කිරීම්වලට සවන් දෙයි. රස විඳියි. | • සරල ළමා ගීතයක්<br><br>හා හා හරි හාවා<br>කැළේ මැදින් ආවා<br>.......................................<br>.......................................<br><br>ගීත රචනය - කුමාරතුංග මුනිදාස | • ගීතයට අනුව තාල තබයි.<br>• ගීතයට සවන් දෙමින් ගීත ගායනයට හුරු වෙයි.<br>• සාමුහික ව ගීතය ගායනා කරයි.<br>• ගීතය රස විඳියි. | 04 |
| | | | | |

විෂය නිර්දේශය - 6 ශ්‍රේණිය

| කථනය | | | | |
|---|---|---|---|---|
| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද සංඛ්‍යාව |
| 2.0<br>පොදු, සිදුවිය හැකි හා කාල්පනික, විවිධ මාතෘකා යටතේ කෙරෙන කතාබස්වලට මැදිහත් වෙමින් ඒවාට උදව්වෙමින් සහභාගී ව කටයුතු කරයි. | 2.1<br>උපදෙස්වලට ප්‍රතිචාර දැක්වීමේ දී මැදිහත් වෙයි. | • ගෙදර පොදු කටයුතුවල දී ලැබෙන උපදෙස් : | • සරල උපදෙස් හඳුනා ගෙන ප්‍රකාශ කරයි.<br>• උපදෙස්වලට වාචික ප්‍රතිචාර දක්වයි.<br>• සරල උපදෙස්වලට අනුව ක්‍රියා කරයි. | 04 |
| | **2.2**<br>මග විමසීම්වලට ප්‍රතිචාර දැක්වීමේ දී මැදිහත් වෙයි. | • දුරකථනයෙන් මග විමසීම | • අවධානයෙන් සවන් දී ප්‍රශ්න කරයි.<br>• නිවැරදි මග පැහැදිලි කරයි.<br>• නිවැරදි ව නිරවුල් ව මග විමසීම්වලට පිළිතුරු ලබා දෙයි. | 04 |

| කථනය | | | | |
|---|---|---|---|---|
| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද සංඛ්‍යාව |
| | 2.3 සුහද සංවාදවල දී මැදිහත් වෙයි. | • නිවසින් පාසලට යන විට අහඹු ලෙස සිදු වන කතා බහක් | • සංවාදවල දී ප්‍රශ්න අසයි.<br>• සංවාදවල දී තම අදහස් කියයි. | 04 |
| | 2.4 තොරතුරු හුවමාරු කිරීමේ දී මැදිහත් වෙයි. | • සරල තොරතුරු ඇතුළත් නිවසේ සිද්ධියක් | • තොරතුරු පැහැදිලි කර ගැනිමට ප්‍රශ්න අසයි.<br>• තමන් දන්නා තොරතුරු කියයි. | 04 |
| | 2.5 ගනුදෙනුවල දී මැදිහත් වෙයි. | • වෙළඳ සැලකින් පළතුරු මිල දී ගැනීම. | • ගනුදෙනුවට අදාළ ව ප්‍රශ්න අසයි.<br>• ගනුදෙනුවට අදාළ ව තමන්ගේ අදහස් ප්‍රකාශ කරයි. | 04 |

| කථනය | | | | |
|---|---|---|---|---|
| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද සංඛ්‍යාව |
| | **2.6**<br>**කෙටි සරල වාචික ප්‍රකාශන ඉදිරිපත් කිරීම් කරයි.** | • තමා පිළිබඳ කෙරෙන කෙටි විස්තරයක්.<br><br>මම ............................<br>මගේ නම.................<br><br>මගේ පාසල..................<br><br>මගේ පන්තිය.... .........<br><br>මගේ ගම.............<br><br>මට වයස අවුරුදු..............<br><br>මට අක්ක කෙනෙකුයි මල්ලි කෙනෙකුයි ඉන්නවා. | • තමා පිළිබඳ තොරතුරු ඉදිරිපත් කරයි.<br><br>• සබකෝලයෙන් තොර ව තොරතුරු ඉදිරිපත් කරයි. | 03 |

| කියවීම හා නැරඹීම | | | | |
|---|---|---|---|---|
| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද සංඛ්‍යාව |
| 3.0<br>එදිනෙදා පොදු සිදුවිය හැකි හා වෙනත් අවස්ථා ගැන සමීප හා නුහුරු කතා බස්වලින් සැකසුණු විවිධ පාඨ (Texts) අවබෝධයෙන් කියවා **ප්‍රතිචාර දක්වමින්** ප්‍රධාන තොරතුරු හඳුනා ගනියි. තේරුම් ගනියි. | 3.1<br>**ලිපි හා වෙනත් ලේඛන කියවයි. නරඹයි.** | • උපන් දින සුබ පැතුම් පතක් ලැබීම<br><br>සුබ උපන් දිනයක් වේවා<br>ඔයාට සුබ උපන් දිනයක් | • උපන් දින සුබ පැතුම්වල සඳහන් සරල සුබ පැතීමේ වැකි කියවයි.<br>• එම වැකිය කිහිප වරක් ශබ්ද නගා කියවයි.<br>• එවැනි වෙනත් සුබ පැතීම් කියවයි. | 02 |
| | 3.2<br>**සාහිත්‍යමය පාඨ කියවයි. නරඹයි.** | • **සරල ළමා ගීතයක ගී පද කියවීම හා ගායනය**<br><br>හා හා හරි හාවා<br>කැලේ මැදින් ආවා<br>යන ගීතය<br><br>කුමාරතුංග මුනිදාස - ගීත රචනය | • තාල තබමින් ගීතය රස විඳියි.<br>• සාමූහික ව ගීතය ගායනා කරයි.<br>• ගීතයේ සරල අදහස තේරුම් ගනියි.<br>• තනි තනි ව ගීතය ගායනා කරයි. | 03 |

| කියවීම හා නැරඹීම | | | | |
|---|---|---|---|---|
| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද සංඛ්‍යාව |
| | 3.3<br>උපදෙස් කියවයි. නරඹයි. | • වෛද්‍ය උපදෙස් පැතිමක් | • වඩාත් සරල උපදෙස් කියවයි.<br>• උපදෙස් කියවා බලා තේරුම් ගෙන ක්‍රියාකරයි.<br>• උපදෙස් කියවා අන් අයට පහදයි. | 02 |
| | 3.4<br>ශ්‍රව්‍ය දෘශ්‍ය පාඨ හා වෙනත් මාධ්‍ය තොරතුරු කියවයි. නරඹයි. | • පිපාසිත කපුටා වතුර සොයා ගිය කතන්දරය | • කතන්දරයක රූප බලා ඒවාට අදාළ වැකි කියවයි.<br>• නිවැරදි හඬ පාලනයෙන් යුතු ව කියවයි.<br>• එවැනි තවත් සරල ළමා කතන්දර කියවයි. | 03 |

| ලිවීම | | | | |
|---|---|---|---|---|
| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද සංඛ්‍යාව |
| 4.0<br>පොදු, සිදුවිය හැකි සහ කාල්පනික අවස්ථා ගැන සුපුරුදු සහ නුහුරු භාෂා රටාවකින් යුතු, කෙටි, සරල හා ගළපන ලද පාඨ ලියයි. | 4.1 විස්තර පාඨ ලියයි. | • සරල අකුරු හා පිල්ලම් ලිවීම<br>• අකුරු දෙකේ තුනේ වචන ලිවීම<br>• අර්ථ සහිත වචන ලිවීම සඳහා පිල්ලම් භාවිතය | • සරල අකුරු ලියයි.<br>• පිල්ලම් සහිත අකුරු ලියයි.<br>• සරල අකුරු හා පිල්ලම් සහිත (අකුරු දෙකේ සහ තුනේ) වචන ලියයි. | 04 |
| | 4.2<br>නිර්මාණාත්මක පාඨ ලියයි. | • තමා පිළිබඳ විස්තර කිහිපයක් ලිවීම<br>මගේ නම ................<br>මගේ පාසල..............<br>මගේ ගම ..................•<br>• නිවසේ පරිසරය ඇසුරින් සරල වාක්‍ය ලිවීම. | • සරල වාක්‍ය ලිවීමේ හුරුව ලබයි.<br>• සරල වාක්‍ය ලියයි. | 04 |

# දෙවන බස සිංහල
# 6 ශ්‍රේණිය
# විෂය අන්තර්ගතය

| නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය 6 ශ්‍රේණිය |
|---|---|
| සවන්දීම<br>1.1 | • අම්මා, තාත්තා<br>අන්න, මෙන්න<br>යනවා, තියෙනවා |
| 1.2 | • ඒ, මේ, අර<br>යන්න, ගන්න, ඉන්න<br>යනවා, ඉන්නවා, ඉන්නෙ |
| 1.3 | • කෝ?, කොහේද ?<br>උඩ, යට<br>ළඟ |
| 1.4 | • කරුණාවෙන්, සවන් දෙන්න, කරුණාකර<br>ඒ, දැන් |
| 1.5 | • ආවා,<br>කෑවා, ගෑවා, පෑවා, ලෑවා<br>බීවා, කීවා |
| කථනය<br>2.1 | • අත සෝදන්න කුඩෙට දමන්න.<br>කෑම බෙදන්න, කුණු දමන්න, වළට දමන්න. |
| 2.2 | • තියෙනවා, වමට හැරෙන්න මීටර් සීයක් විතර ඉස්සරහට එන්න. |
| 2.3 | • මහන්සියි,<br>බස් එකක් ගත්තා ද? |
| 2.4 | • ගෙනාවා, ගෙනල්ලා ඉස්සර වෙලා<br>රසයි, ගුණයි, හොඳයි |
| 2.5 | • එක ගෙඩියක්, ගෙඩි දෙකක්, ගෙඩි තුනක්<br>කීය ද? කොච්චරක් ද? එකක් කීය ද? එකක් දහයයි. |
| 2.6 | • මම, මගේ, මට, මාත් එක්ක,<br>අය්යගේ, නංගිගෙ කෙනෙක් |

| නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය 6 වන ශ්‍රේණිය |
|---|---|
| **කියවීම**<br>3.1 | • ආයුබෝවන්! සෙත් වේවා! ජයවේවා!<br>බුදු සරණ වේවා! සුබ උපන් දිනයක් වේවා!<br>අපි, ඔයා, ඔබට |
| 3.2 | • ආවා, කෑවා, පෑවා, ගෑවා<br>බීවා, කීවා |
| 3.3 | • තබන්න, සොලවන්න, වහන්න,<br>... සැරයක්, ... ... දෙකක් |
| 3.4 | • ඌ, ටික ටික, ටිකක්<br>ඊට පස්සේ |
| ලිවීම<br><br>4.1 | • සිංහල අකුරු ලිවීම,<br>පිලි යොදා අකුරු, වචන ලිවීම |
| 4.2 | • මම,<br>මගේ පාසලට ................ ................ |

# ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා උපදෙස්

- සවන්දීම
- කථනය
- කියවීම හා නැරඹීම
- ලිවීම

## සවන් දීම

**නිපුණතාව 1.0 :** එදිනෙදා පොදු අවස්ථා හා සිදු විය හැකි අවස්ථා පිළිබඳ සමීප බස් වහරකින් ගළපා මැනවින් සැකසූ පාඨවලට (Texts) සවන් දෙමින්, ප්‍රතිචාර දක්වමින් හඳුනා ගනියි. තේරුම් ගනියි.

**නිපුණතා මට්ටම 1.1 :** සුහද කතාබහට සවන් දෙයි. ප්‍රතිචාර දක්වයි.

**කාලච්ඡේද :** 03යි.

**ඉගෙනුම් පල :**

- අලුත් වචන හඳුනා ගෙන භාවිත කරයි.
- අවස්ථාවට ගැළපෙන සේ ප්‍රතිචාර දක්වයි.
- සුහද කතාබහේ යෙදෙයි.

**පාඩම සැලසුම සඳහා උපදෙස් :**

- නිපුණතා මට්ටමට අදාළ පෙළ පොතේ පාඩම තෝරා ගන්න.
- ගුරුවරයා හෝ හඬ පටයක් මගින් හෝ එය ශිෂ්‍යයන්ට සවන් දීමට සලස්වන්න.
- පාඩම කිහිප වරක් ඇසීමට අවස්ථාව ලබා දෙන්න.
- පාඩමේ ඇතුළත් සුහද කතාබස්වල දී භාවිත වචන ඉස්මතු කරවන්න.
- **මූලික වදන්හි** ඇති වචන භාවිතයට ගන්න.
- පාඩමට අදාළ අභ්‍යාස කරවන්න.
- **පුහුණුව** සඳහා ලබා දී ඇති වචන/වාක්‍ය රටා ක්‍රියාකාරකම් සඳහා යොදා ගන්න.

**මූලික වදන් :**

- **රැකියාවට ගිය පියා නිවසට පැමිණීම**

| | | | | |
|---|---|---|---|---|
| **තාත්තා** | පින්තූරය | **එනවා** | බල්ලා | අන්න |
| **අම්මා** | **පොත** | **යනවා** | පූසා | මෙන්න |
| අය්යා | පුටුව | **ඉන්නවා** | | |
| **අක්කා** | ඇඳ | **තියෙනවා** | | |
| මල්ලී | ඉදල | | | |
| **නංගී** | කඩයට | | | |
| | කාමරයට | | | |
| | පාරට | | | |
| | මිදුලට | | | |

- **පුහුණුව සඳහා යොදා ගන්න.**

| **එනවා** | **යනවා** | **තියෙනවා** |
|---|---|---|
| තාත්තා එනවා. | තාත්තා යනවා. | කොස්ස තියෙනවා. |
| අයියා එනවා. | අයියා යනවා. | පින්තූරය තියෙනවා. |
| අක්කා එනවා. | අක්කා යනවා. | පොත තියෙනවා. |

| **ඉන්නවා** | **අන්න** | **මෙන්න** |
|---|---|---|
| තාත්තා ඉන්නවා | අන්න තාත්තා | මෙන්න තාත්තා |
| අම්මා ඉන්නවා | අන්න අම්මා | මෙන්න අම්මා |
| අයියා ඉන්නවා | අන්න අයියා | මෙන්න අයියා |
| අක්කා ඉන්නවා | අන්න අක්කා | මෙන්න අක්කා |

**ගුණාත්මක යෙදවුම් ඃ**

- පෙළ පොතේ අදාළ පාඩම
- පෙළ පොතේ නියමිත පාඩම් ඇතුළත් දෙබස් සහිත හඬ පටයක් (සකස් කර ගත්)

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් ඃ**

**පහත සඳහන් නිර්ණායක යොදා ගන්න.**

- මූලික වදන්වල ඇති වචන හඳුනා ගෙන ප්‍රකාශ කරයි.
- ගුරුවරයා අසන ප්‍රශ්නවලට කෙටි පිළිතුරු දෙයි.
- සරල වචන භාවිත කරමින් අදහස් හුවමාරු කර ගනියි.

## වචන මාලාව

| | | | |
|---|---|---|---|
| තාත්තා | - அப்பா | බල්ලා | - நாய் |
| අම්මා | - அம்மா | පූසා | - பூனை |
| අය්යා | - அண்ணா | | |
| අක්කා | - அக்கா | | |
| මල්ලී | - தம்பி | එනවා | - வருதல். |
| නංගී | - தங்கை | යනවා | - போகுதல். |
| | | ඉන්නවා | - இருக்கிறார். |
| | | තියෙනවා | - இருக்கிறது உண்டு |

පින්තූරය - படம்

පොත - புத்தகம்

පුටුව - கதிரை

ඇඳ - கட்டில்

ඉදල - விளக்குமாறு

කොස්ස - தும்புத்தடி

පාරට - வீதிக்கு

මිදුලට - முற்றத்திற்கு

කඩයට - கடைக்கு

කාමරයට - அறைக்கு

අන්න - அதோ

මෙන්න - இதோ

# සවන් දීම

**නිපුණතාව 1.0 :** එදිනෙදා පොදු අවස්ථා හා සිදු විය හැකි අවස්ථා පිළිබඳ සමීප බස් වහරකින් ගළපා මැනවින් සැකසූ පාඨවලට සවන් දෙමින්, ප්‍රතිචාර දක්වමින් හඳුනා ගනියි. තේරුම් ගනියි.

**නිපුණතා මට්ටම 1.2 :** උපදෙස්වලට සවන් දෙයි. ප්‍රතිචාර දක්වයි.

**කාලච්ඡේද :** 03යි.

**ඉගෙනුම් පල :**

- උපදෙස් සහිත වචන හඳුනා ගෙන ප්‍රකාශ කරයි.
- උපදෙස්වලට ප්‍රතිචාර දක්වයි.
- උපදෙස් අනුව කටයුතු කරයි.

**පාඩම් සැලසුම සඳහා උපදෙස් :**

- නිපුණතා මට්ටමට අදාළ පෙළ පොතේ පාඩම ගුරුවරයා හෝ හඬ පටයක් හෝ මගින් ශිෂ්‍යයන්ට සවන් දීමට සලස්වන්න.
- පාඩම කිහිප වරක් ඇසීමට සලස්වන්න.
- පාඩමෙහි ඇතුළත් **සරල උපදෙස්** කෙරේ ශිෂ්‍ය අවධානය යොමු කරන්න.
- පාඩමේ ඇතුළත් උපදෙස් ශිෂ්‍යයන්ගෙන් විමසමින් ප්‍රතිචාර ලබා ගන්න.
- **මූලික** වදන් කෙරේ අවධානය යොමු කරවන්න.
- පුහුණුව සඳහා දී ඇති ක්‍රියාකාරකමෙහි ශිෂ්‍යයින් යොදවන්න.

**මූලික වදන් :**

- **නිවසේ දී ලබා දෙන සරල උපදෙස්**

| | | | |
|---|---|---|---|
| පුතා | කන්න | යන්න | ඒ |
| දුව | බොන්න | එන්න | අර |
| පොත | බලන්න | ගන්න | මේ |
| පෑන | තියන්න | | |
| බෝතලය | කතා කරන්න | | |
| තේ | සෝදන්න | | |
| ඔයා | ඉඳ ගන්න | | |
| මූණ | නැගිටින්න | | |
| වතුර | නවතින්න | | |

- **පුහුණුව සඳහා යොදා ගන්න.**

| | | |
|---|---|---|
| පුතා | යන්න | |
| දුව | යන්න | |
| ඔයා | යන්න | |
| | | |
| පුතා | කාමරයට | යන්න |
| දුව | කාමරයට | යන්න |
| ඔයා | කාමරයට | යන්න |
| | | |
| මේ | පොත | ගන්න |
| ඒ | පොත | ගන්න |
| අර | පොත | ගන්න |

**ගුණාත්මක යෙදවුම් :**

- පෙළ පොතේ අදාළ පාඩම
- නියමිත පාඩම ඇතුළත් හඬ පටයක්

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

**පහත සඳහන් නිර්ණායක යොදා ගන්න.**

- උපදෙස් සහිත වචන හඳුනා ගෙන කියයි.
- වචන ශබ්ද නගා නිවැරදි ව උච්චාරණය කරයි.
- උපදෙස්වලට ප්‍රතිචාර දක්වයි.
- උපදෙස් පිළිපැදීමට කැමැත්ත පළ කරයි.

වචන මාලාව

| | | |
|---|---|---|
| පුතා | மகன் | මේ – இது |
| දුව | மகள் | ඒ – அது/அந்த |
| ඔයා | நீங்கள் | අර - அது |
| පෑන | பேனை | |
| බෝතලය | போத்தல் | |
| තේ | தேநீர் | |
| වතුර | தண்ணீர் | |
| මූණ | முகம் | |
| යන්න | போ/போங்கள்/போங்க | |
| එන්න | வா/வாங்க/வாங்கோ/வாருங்கள். | |
| කන්න | சாப்பிடுங்கள் | |
| බොන්න | குடியுங்கள். | |
| ගන්න | எடுங்கள் | |
| බලන්න | பாருங்கள் | |
| කියන්න | சொல்லுங்கள்/கூறுங்கள் | |
| කතා කරන්න | கதையுங்கள்/பேசுங்கள் | |
| සෝදන්න | கழுவுங்கள் | |
| ඉඳ ගන්න | அமருங்கள்/உட்காருங்கள் | |
| නැගිටින්න | எழும்புங்கள் | |
| නවතින්න | நில்லுங்கள் | |

**නිපුණතාව 01 :** එදිනෙදා පොදු අවස්ථා හා සිදුවිය හැකි අවස්ථා පිළිබඳ සමීප බස් වහරකින් ගළපා මැනවින් සැකසූ පාඨවලට සවන් දෙමින් ප්‍රතිචාර දක්වමින් හඳුනා ගනියි. තේරුම් ගනියි.

**නිපුණතා මට්ටම 1.3 :** යමක් පිළිබඳ විමසීම් හා මග විමසීම්වලට සවන් දෙයි. ප්‍රතිචාර දක්වයි.

**කාලච්ඡේද** : 03යි.

**ඉගෙනුම් පල** :

- විමසීම් අවස්ථාව හඳුනා ගෙන ප්‍රකාශ කරයි.
- තොරතුරු අනුව නිවැරදි මග සොයා ගනියි.
- අවධානයෙන් සවන් දිය යුතු බව පිළිගනියි.

**පාඩම සැලසුම සඳහා උපදෙස් :**

- නිපුණතා මට්ටමට අදාළ පෙළ පොතේ **පූසා කෝ** පාඩම ගුරුවරයා විසින් හෝ හඬ පටයක් මගින් හෝ ශිෂ්‍යයන්ට සවන් දීමට සලස්වන්න.
- පාඩම කිහිප වරක් ඇසීමට සලස්වන්න.
- පාඩමෙහි ඇතුළත් විමසීම්වල භාවිත පද රටා ඉස්මතු කරවන්න.
- එහි දී විමසීම්ලට අදාළ වාක් කෝෂය හා පද රටා කෙරෙහි අවධානය යොමු කරවන්න.
- පහත සඳහන් මූලික වදන්හි සඳහන් වචන කෙරේ අවධානය යොමු කරන්න.
- ශිෂ්‍යයන්ගේ සහභාගිත්වය සහිත විමසීම් ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- පාඩමට අදාළ ක්‍රියාකාරකම් කරවන්න.
- පුහුණුව සඳහා ලබා දී ඇති ක්‍රියාකාරකමෙහි නිරත කරවන්න.

**මූලික වදන් :**

- ගෙදර පරිසරයෙන් යමක්/යමෙක් සෙවීම
  (පූස් පැටියා නැති වී සෙවීම)

| | | | |
|---|---|---|---|
| **කෝ ?** | **පූසා** | පෙට්ටියේ | **ඉන්නවා** |
| **කොහේ ද?** | බල්ලා | කුඩයේ | |
| | උඟ | ඇඳ යට | |
| | | **ගහ උඩ** | |

- **පුහුණුව සඳහා යොදා ගන්න.**

පූසා කෝ ?

බල්ලා කෝ ?

පූසා පෙට්ටියේ

පූසා කුඩයේ

**ගුණාත්මක යෙදවුම් :**

- පෙළ පොත
- නියමිත පාඩම ඇතුළත් හඬ පටයක්
- පින්තූර සහිත දෙබස්

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

**පහත සඳහන් නිර්ණායක යොදා ගන්න.**

- මග විමසීම් අවස්ථාව හඳුනා ගෙන ප්‍රකාශ කරයි.
- මග විමසීම්වල දී භාවිත වචන ප්‍රකාශ කරයි.
- මග විමසුම්වලට අනුව කටයුතු කරයි.

## වචන මාලාව

| | |
|---|---|
| කෝ ? | - எங்கே |
| කොහේ ද ? | - அவ்விடத்தில், எங்கே |
| පූසා | - பூனை |
| බල්ලා | - நாய் |
| ඌ | - அது |
| පෙට්ටියේ | - பெட்டியில் |
| කූඩයේ | - கூடையில் |
| ඇඳ යට | - கட்டிலுக்குக் கீழ் |
| ගහ උඩ | - மரத்தின் மேல் |
| ඉන්නවා | - இருக்கிறது |
| ඉන්නේ | - , ருப்பது |

**නිපුණතාව 1.0 :** එදිනෙදා පොදු අවස්ථා හා සිදුවිය හැකි අවස්ථා පිළිබඳ සමීප බස් වහරකින් ගළපා මැනවින් සැකසූ පාඨවලට සවන් දෙමින් ප්‍රතිචාර දක්වමින් හඳුනා ගනියි. තේරුම් ගනියි.

**නිපුණතා මට්ටම 1.4 :** නිවේදනවලට සවන් දෙයි. ප්‍රතිචාර දක්වයි.

**කාලච්ඡේද : 04යි**

**ඉගෙනුම් පල :**

- සවන් දුන් නිවේදනයේ ඇතුළත් තොරතුරු කියයි.
- නිවේදනයකට අවධානයෙන් සවන් දී ප්‍රතිචාර දක්වයි.
- සවන් දුන් නිවේදනයට අනුව කටයුතු කරයි.

**පාඩම සැලසුම සඳහා උපදෙස් :**

- නිපුණතා මට්ටමට අදාළ පෙළ පොතේ පාඩම ගුරුවරයා හෝ හඬ පටයක් හෝ මගින් ශිෂ්‍යයන්ට සවන් දීමට සලස්වන්න.
- නිවේදනය කිහිප වරක් ඇසීමට සලස්වන්න.
- නිවේදනයේ ඇතුළත් ප්‍රධාන තොරතුරු කෙරෙහි ශිෂ්‍ය අවධානය යොමු කරවන්න.
- මූලික වදන් කෙරේ අවධානය යොමු කරවන්න.
- නිවේදනයෙහි සඳහන් තොරතුරු ශිෂ්‍යයන්ට ඉදිරිපත් කිරීමට අවස්ථාව දෙන්න.
- පුහුණුව සඳහා ලබා දී ඇති ක්‍රියාකාරකම්හි යොදවන්න.

**මූලික වදන් :**

- **නිවැසියන් දුම්රියෙන් ගමනක් යාම**

| | | |
|---|---|---|
| **දුම්රිය** | කරුණාකර<br>**කරුණාවෙන්** | ඒ |
| දුම්රියක් | සවන් දෙන්න | දුන් |
| **ටිකට්** | **ලබා ගන්න** | |
| වේදිකාවට | එනවා | |
| වවුනියාවට | යනවා | |

- **පුහුණුව සඳහා යොදාගන්න.**
    - කරුණාවෙන් සවන් දෙන්න.
    - සවන් දෙන්න.
    - වේදිකාවට

**ගුණාත්මක යෙදවුම් :**

- සරල නිවේදනයක් (දුම්රිය ස්ථානයක ඇසෙන)
- පාසලේ උදය රැස්වීමේ කරන නිවේදනයක්
- නියමිත පාඩම ඇතුළත් පෙළ පොත

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

**පහත සඳහන් නිර්ණායක යොදා ගන්න.**

- නිවේදනයේ ඇතුළත් පණිවිඩය ප්‍රකාශ කරයි.
- නිවේදනයකට අනුව කටයුතු කරයි.
- නිවේදනයෙන් ලද තොරතුරු පිළිබඳ සතුට ප්‍රකාශ කරයි.

## වචන මාලාව

| | | |
|---|---|---|
| දුම්රිය | - | புகையிரதம் |
| දුම්රියක් | - | புகையிரதமொன்று |
| ටිකට් | - | பிரவேசப்பத்திரம் |
| වේදිකාවට | - | மேடைக்கு |
| වවුනියාවට | - | வவுனியாவுக்கு |
| කරුණාවෙන් | - | தயவுசெய்து |
| සවන් දෙන්න | - | செவிமடுங்கள் |
| එනවා | - | வருகிறார் |
| යනවා | - | போகிறார் |
| ලබා ගන්න | - | பெற்றுக் கொள்ளுங்கள் |
| ඒ | - | அது, அந்த |
| දැන් | - | இப்பொழுது |

**නිපුණතාව 1.0 :** එදිනෙදා පොදු අවස්ථා හා සිදුවිය හැකි අවස්ථා පිළිබඳ සමීප බස් වහරකින් ගළපා මැනවින් සැකසූ පාඨවලට සවන් දෙමින් ප්‍රතිචාර දක්වමින් හඳුනා ගනියි. තේරුම් ගනියි.

**නිපුණතා මට්ටම 1.5 :** ගුවන් විදුලි ප්‍රචාර හා පටිගත කිරීම්වලට සවන් දෙයි. රස විඳියි.

**කාලච්ඡේද :** 04යි.

**ඉගෙනුම් පල :**

- ගීතයට අනුව තාල තබයි.
- ගීතයට සවන් දෙමින් ගීත ගායනයට හුරු වෙයි.
- සාමූහික ව/ තනි තනි ව ගීතය ගායනා කරයි.
- ගීතය රස විඳියි.

**පාඩම සැලසුම සඳහා උපදෙස් :**

- නිපුණතා මට්ටමට අදාළ පාඩම තෝරා ගන්න.
- ළමා ගීතයට කීප වරක් සවන් දෙන්නට සලස්වන්න.
- ශිෂ්‍යයන් සමග එක් වී තාලානුකූල ව ගායනා කරන්න.
- ගීතයෙන් කියවෙන දේ තේරුම් ගැනීමට පහසු වන පරිදි විස්තර කරන්න.
- සාමූහික වශයෙන්/තනි තනි ව ගීතය ගායනා කිරීමට හා රස විඳීමට ශිෂ්‍යයන්ට අවස්ථාව ලබා දෙන්න.

**මූලික වදන් :**

- **සරල ළමා ගීතයක්**

1. හා හා හරි හාවා
   කැළේ මැදින් ආවා
   හිට ගෙන ගඟ ගාවා
   වට පිට ඇහැ ලෑවා

2. කොළ දෙකටක් කෑවා
   පැන් උගුරක් බීවා
   තොල කට ලෙව කෑවා
   ඉතින් ඇතැයි කීවා

3. තබා නිකට ගාවා
   වීණාවක් ගෑවා
   මිහිරි සින්දු කීවා
   නැටුම් ටිකක් පෑවා

**ගීත රචනය :** කුමාරතුංග මුනිදාස

**ගුණාත්මක යෙදවුම්:**

- හා හා හරි හාවා - (ගායනය - නන්දා මාලනී) CD පටය/කැසට් පටය
- පෙළ පොතේ නියමිත පාඩම

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

**පහත සඳහන් නිර්ණායක යොදා ගන්න.**

- ගීතයට අවධානයෙන් සවන් දෙමින් තාල තබයි.
- තාල තබමින් ගීත ගායනයට හුරුව ලබයි.
- ගීතය සාමූහික ව/තනි තනි ව ගායනා කරයි.
- ගයමින්, අසමින් ප්‍රීතිය පළ කරයි.

**පුහුණුව සඳහා යොදා ගන්න :**

- **සරල ළමා ගීතයක්**

1. හා හා හරි හාවා
   කැළේ මැදින් ආවා
   හිට ගෙන ගඟ ගාවා
   වට පිට ඇහැ ලෑවා

2. කොළ දෙකටක් කෑවා
   පැන් උගුරක් බීවා
   තොල කට ලෙව කෑවා
   ඉතින් ඇතැයි කීවා

3. තබා නිකට ගාවා
   වීණාවක් ගෑවා
   මිහිරි සින්දු කීවා
   නැටුම් ටිකක් පෑවා

**ගීත රචනය :** කුමාරතුංග මුනිදාස

## කථනය

**නිපුණතාව 2.0 :** පොදු සිදු විය හැකි හා කාල්පනික , විවිධ මාතෘකා යටතේ කෙරෙන කතාබස්වලට මැදිහත් වෙමින් ඒවාට ප්‍රතිචාර දක්වමින් සහභාගී ව කටයුතු කරයි.

**නිපුණතා මට්ටම 2.1 :** උපදෙස්වලට ප්‍රතිචාර දැක්වීමේ දී මැදිහත් වෙයි.

**කාලච්ඡේද :** 04යි.

**ඉගෙනුම් පල :**

- සරල උපදෙස් හඳුනා ගෙන ප්‍රකාශ කරයි.
- උපදෙස්වලට වාචික ව ප්‍රතිචාර දක්වයි
- සරල උපදෙස්වලට අනුව ක්‍රියා කරයි.

**පාඩම සැලසුම සඳහා උපදෙස් :**

- නිපුණතා මට්ටමට අදාළ ව සකසා ඇති පෙළ පොතේ පාඩම තෝරාගන්න.
- එම පාඩම ශිෂ්‍යයන්ට නිවැරදි ව ඇසෙන සේ නිසි උච්චාරණයෙන් යුතු ව කිහිප වතාවක් කියවන්න.
- කැමති ශිෂ්‍යයන් කිහිප දෙනෙකුට කොටස් වශයෙන් කියවීමට අවස්ථාව ලබා දෙන්න.
- මෙහි ඇති උපදෙස් සිසුන්ට අවබෝධ කර දෙන්න.
- එම උපදෙස් ශිෂ්‍යයන් තුළ තහවුරු කරන්න.
- පාඩමේ සිද්ධි හා අවස්ථා මගින් උපදෙස් තේරුම් ගැනීමට අවස්ථාව සලස්වන්න.
- දී ඇති වචන භාවිත කර සරල උපදෙස් ප්‍රකාශ කිරීමට ශිෂ්‍යයන්ට අවස්ථාව ලබා දෙන්න.
- පාඩමට අදාළ ක්‍රියාකාරකම් හා අභ්‍යාස මගින් උපදෙස් තේරුම් ගෙන ප්‍රතිචාර දැක්වීමට හුරු කරවන්න.
- පන්ති කාමරයේ ශිෂ්‍යයන් සහභාගි කර ගනිමින් උපදෙස්වලට ප්‍රතිචාර දැක්වීමේ ක්‍රියාකාරකම්වල නිරත කරවන්න.
- පුහුණුව සඳහා ලබා දී ඇති ක්‍රියාකාරකම්හි යොදවන්න.

**මූලික වදන් ඃ**

- **නිවසෙහි කෑම ගන්නා අවස්ථාවක්**

| | | | |
|---|---|---|---|
| **අත** | **වතුර** | **ඉස්සර වෙලා** | ගන්න |
| **කෑම** | වීදුරුව | **දැන්** | කන්න |
| **කිරිබත්** | කෝප්පය | | **දමන්න** |
| ඉඳි ආප්ප | | | **වාඩිවෙන්න** |
| පිට්ටු | හැන්ද | | **බෙදන්න** |
| ආප්ප | **කුණු** | | බොන්න |
| කෙසෙල් ගෙඩි | **වළට** | | **හෝදන්න** |
| අල හොදි | පිඟානට | | |

- **පුහුණුව සඳහා යොදා ගන්න.**

අත සෝදන්න.

පිඟාන සෝදන්න.

කිරිබත් බෙදන්න.

ඉඳි ආප්ප බෙදන්න.

කෑම බෙදන්න.

කුණු , වළට දමන්න.

වතුර පිඟානට දමන්න.

**ගුණාත්මක යෙදවුම් ඃ**

- කුණු කුඩයකට දමන පින්තූරයක්
- කෑමට පෙර අත සෝදන දර්ශනයක පින්තූරයක්
- පෙළ පොතේ නියමිත පාඩම

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් ඃ**

**පහත සඳහන් නිර්ණායක යොදා ගන්න.**

- සරල උපදෙස් හඳුනා ගෙන ප්‍රකාශ කරයි.
- අලුත් වචන නිවැරදි ව ශබ්ද නගා ප්‍රකාශ කරයි.
- ගුරුවරයාගේ වාචික උපදෙස්වලට නිවැරදි ව වාචික ප්‍රතිචාර දක්වයි.
- උපදෙස් අනුව කටයුතුවල කිරීමට කැමැත්ත පළ කරයි.

## වචන මාලාව

| | | |
|---|---|---|
| අත | - | கை |
| කෑම | - | உணவு |
| කිරිබත් | - | பாற்சோறு |
| ඉඳිආප්ප | - | இடியப்பம் |
| පිට්ටු | - | பிட்டு |
| ආප්ප | - | அப்பம் |
| කෙසෙල්ගෙඩි | - | வாழைப்பழம் |
| අල හොදි | - | கிழங்குச் சொதி |
| වතුර | - | நீர் |
| වීදුරුව | - | கண்ணாடிக் குவளை |
| පිඟානට | - | பீங்கானுக்கு |
| කෝප්පය | - | கோப்பை |
| හැන්ද | - | கரண்டி |
| කුණු | - | குப்பை |
| වළට | - | கிடங்கு/குழி |

| | | |
|---|---|---|
| ගන්න | - | எடுங்கள் |
| කන්න | - | சாப்பிடுங்கள் |
| බොන්න | - | குடியுங்கள் |
| දමන්න | - | போடுங்கள் |
| වාඩිවෙන්න | - | உட்காருங்கள் |
| බෙදන්න | - | பகிருங்கள் |
| හෝදන්න | - | கழுவுங்கள் |
| ඉස්සර වෙලා | - | முன்பதாக |
| දැන් | - | இப்பொழுது |

**නිපුණතාව 2.0 :** පොදු සිදු විය හැකි සහ කාල්පනික, විවිධ මාතෘකා යටතේ කෙරෙන කතාබස්වලට මැදිහත් වෙමින් ඒවාට ප්‍රතිචාර දක්වමින් සහභාගී ව කටයුතු කරයි.

**නිපුණතා මට්ටම** 2.2 : මග විමසීම්වලට ප්‍රතිචාර දැක්වීමේ දී මැදිහත් වෙයි.

**කාලච්ඡේද : 04යි.**

**ඉගෙනුම් පල :**

- අවධානයෙන් සවන් දෙමින් ප්‍රශ්න කරයි.
- නිවැරදි මග පැහැදිලි කරයි.
- නිවැරදි ව නිරවුල් ව මග විමසීම්වලට පිළිතුරු ලබා දෙයි.

**පාඩම සැලසුම සඳහා උපදෙස්:**

- පෙළ පොතේ අදාළ පාඩම තෝරා ගන්න. (නුවර මාමා)
- එම පාඩම ශිෂ්‍යයන්ට සවන් දීමට සලස්වන්න.
- ශිෂ්‍යයන් ලවා දෙබස් ප්‍රකාශ කිරීමට සලස්වන්න.
- සියලු ශිෂ්‍යයන්ගේ සහභාගිත්වය ලබා ගන්න.
- පාඩමේ ඇති ක්‍රියාකාරකම් හා අභ්‍යාස අවබෝධයෙන් යුතු ව සිදු කරන්න.
- **මූලික වදන්හි** ඇති පද රටා, භාෂා රටා ශිෂ්‍යයන්ට හුරු කරවන්න.
- පුහුණුව සඳහා ලබා දී ඇති ක්‍රියාකාරකම්හි ශිෂ්‍යයින් යොමු කරවන්න.

මූලික වදන් :

- **දුරකථනයෙන් මග විමසීමක දී භාවිත වන වචන**

| | | | |
|---|---|---|---|
| **මාමේ** | තාප්පය | **හැරෙන්න** | **ඉස්සරහට** |
| **පුතේ** | **කහපාට** | තියෙනවා | විතර |
| ඔයාගේ | උස | එන්න | දැන් |
| **ඔයාලගේ** | **මීටර් 100 ක්** | **පේනවා** | එහෙනම් |
| පුතාලගේ | වමට | ඉන්නේ | **එතනින්** |
| | **පැත්ත** | **ඉන්නවා ද?** | හවස |
| | **දකුණු** | **මතක නෑ** | එන කොට |
| | ලොකු | | |

- **පුහුණුව සඳහා යොදා ගන්න.**

අඹ ගහක් තියෙනවා.

තාප්පයක් තියෙනවා.

ගේට්ටුවක් තියෙනවා.

එතනින් වමට හැරෙන්න.

එතනින් දකුණට හැරෙන්න.

තාර පාර දිගේ ඉස්සරහට එන්න.

පන්සල් පාර දිගේ ඉස්සරහට එන්න.

මීටර් සියයක් විතර එන්න.

මීටර් පනහක් විතර එන්න.

**ගුණාත්මක යෙදවුම් :**

- පටිගත කරන ලද දුරකථන සංවාදයක්.
- විවිධ පුද්ගලයන් දුරකථනයෙන් කතා කරන අවස්ථා දැක්වෙන පින්තූර කිහිපයක්
- පෙළ පොතේ නියමිත පාඩම

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

**පහත සඳහන් නිර්ණායක යොදා ගන්න.**

- මග විමසීම හඳුනා ගෙන ප්‍රකාශ කරයි.
- ගුරුවරයාගේ වාචික විමසීම් සඳහා නිවැරදි ව පිළිතුරු දක්වයි.
- අදාළ වචන භාවිත කරමින් සාමූහික ව විමසීම්වල නිරත වෙයි.
- අන් අයගේ විමසීම්වලට වාචික ව ප්‍රතිචාර දක්වයි.
- මග සලකුණු නිවැරදි ව ප්‍රකාශ කළ යුතු බව පිළිගනියි.

## වචන මාලාව

| | | | |
|---|---|---|---|
| මාමේ | மாமா | වතුර | தண்ணீர் |
| පුතේ | மகன்/மகனே | ඉන්නව ද | இருக்கிறதா |
| ඔයාගේ | உங்களின் | ඉන්නේ | இருக்கிறது |
| තාප්පය | மதில் | එතනින් | அவ்விடத்தில் |
| කහපාට | மஞ்சள் நிறம் | හවස | மாலை |
| අඹ ගහක් | மாமரம் ஒன்று | එනකොට | வரும்போது |
| ගෙදර | வீடு | | |
| කුස්සියේ | சமயல் அறையில் | | |
| මීටර් 100ක් | 100 மீற்றர் | | |
| වමට | இடது | | |
| පැත්ත | பக்கம் | | |
| දකුණු | வலது | | |
| ලොකු | பெரிது | | |
| හැරෙන්න | திரும்புங்கள் | | |
| තියෙනවා | உண்டு/இருக்கிறது | | |
| එන්න | வாருங்கள் | | |
| පේනවා | தெரிகிறது | | |
| ඉස්සරහට | முன்னால் | | |
| මතක නෑ | ஞாபகமில்லை/நினைவில்லை | | |
| අදත් | இன்றைக்கும்/இன்றும் | | |
| එහෙනම් | அப்படியானால் | | |

**නිපුණතාව 2.0 :** පොදු සිදු විය හැකි හා කාල්පනික විවිධ මාතෘකා යටතේ කෙරන කතාබස්වලට මැදිහත් වෙමින් ඒවාට ප්‍රතිචාර දක්වමින් සහභාගී ව කටයුතු කරයි.

**නිපුණතා මට්ටම** 2.3 : සුහද සංවාදවල දී මැදිහත් වෙයි.

**කාලච්ඡේද** : 04යි.

**ඉගෙනුම් පල** :

- සංවාදවල දී ප්‍රශ්න අසයි.
- සංවාදවල දී තම අදහස් කියයි.

**පාඩම සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

- නිපුණතා මට්ටමට අදාළ පාඩම පෙළ පොතින් තෝරා ගන්න.
- නිවසින් පාසලට යන අතරතුර තමා මුහුණ දීමක් ගැන සාකච්ඡා කරන්න.
- එවැනි විවිධ අවස්ථා ශිෂ්‍යයින්ගෙන් මතු කර ගනියි.
- වඩා සරල සංවාදයකට තම අදහස් එක් කරමින් සහභාගි විය යුතු බව සියලු ශිෂ්‍යයන්ට පවසන්න.
- වාක්‍ය හා පද රටා ශිෂ්‍යයන්ට හුරු කරවීමට සුදුසු ක්‍රියාකාරකම් සකසන්න. ඒ සඳහා මූලික වදන්හි ඇති වචන භාවිත කිරීමේ පුහුණුව සඳහා ශිෂ්‍යයන් ව යොමු කරවන්න.
- පාඩම් පොතෙහි ඇති ක්‍රියාකාරකම් හා අභ්‍යාස ද ශිෂ්‍යයන් ලවා කරවන්න.

මූලික වදන් ඃ

- **නිවසින් පාසලට යාමට සූදානම් වීමේ දී අහඹු ලෙස වැස්සක් ඇද හැලෙන අවස්ථාවක්**

| | | |
|---|---|---|
| දුව | **වැස්සක්** | **ගත්තා ද?** |
| තාත්තා | **කළු පාටයි** | **දුවන්න** |
| | **කුඩේ** | **සද්දේ** |
| | **බස් එක** | එනවා |
| | අහස | **ඇහෙනවා** |
| | පාර | |

- **පුහුණුව සඳහා යොදා ගන්න.**

මට මහන්සි යි.

මට බඩගිනියි.

ළමයා උස යි.

ඒක ලස්සන යි.

අහස කළු පාටයි.

කෑම රස යි.

බස් එකක්

කාර් එකක්

බෑග් එකක්

ටී.වී. එකක්

කුඩේ ගත්තා ද?

බෝතලය ගත්තා ද?

පත්තරය ගත්තා ද?

පොත ගත්ත ද?

පෑන ගත්ත ද?

**ගුණාත්මක යෙදවුම් :**

- පාඩමට අදාළ සංවාදය (සුදුසු ක්‍රමවේදයක්)
- පෙළ පොතේ නියමිත පාඩම

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

**පහත සඳහන් නිර්ණායක යොදා ගන්න.**

- සංවාදයේ ඇතුළත් සිද්ධිය හඳුනා ගෙන ප්‍රකාශ කරයි.
- අදාළ වචන භාවිත කරමින් සරල සංවාදවල නිරත වෙයි.
- අදහස් හුවමාරු කර ගනිමින් සතුටු වෙයි.

## වචන මාලාව

| | | |
|---|---|---|
| දුව | - | மகள் |
| තාත්තා | - | அப்பா |
| වැස්සක් | - | மழை |
| අහස | - | வானம் |
| කළු පාටයි | - | கறுப்பு நிறம் |
| ඔව් | - | ஆம் |
| කුඩේ | - | குடை |
| බස් එක | - | பேருந்து |
| පාරට | - | வீதிக்கு |
| ගත්ත ද? | - | எடுத்தீர்களா? |
| දුවන්න | - | ஓடுங்கள் |
| සද්දෙ | - | சத்தம் |
| එනවා | - | வருகிறார். |
| ඇහෙනවා | - | கேட்கிறது. |
| එන්න | - | வாருங்கள் |

**නිපුණතාව 2.0 :** පොදු සිදුවිය හැකි සහ කාල්පනික විවිධ මාතෘකා යටතේ කෙරෙන කතාබස්වලට මැදිහත් වෙමින් ඒවාට ප්‍රතිචාර දක්වමින් සහභාගී ව කටයුතු කරයි.

**නිපුණතා මට්ටම 2.4 :** තොරතුරු හුවමාරු කර ගැනිමේ දී මැදිහත් වෙයි.

**කාලච්ඡේද :** 04යි.

**ඉගෙනුම් පල :**

- තොරතුරු පැහැදිලි කර ගැනිමට ප්‍රශ්න අසයි.
- තමන් දන්නා තොරතුරු කියයි.

**පාඩම සැලසුම සඳහා උපදෙස් :**

- නිපුණතා මට්ටමට අදාළ **යාපනේ මිදි** පාඩම තෝරා ගන්න.
- එම පාඩම කෙරේ අවධානය යොමු කරවන්න.
- නිවසේ දී සිදු වන එවැනි අවස්ථා ශිෂ්‍යයන්ගෙන් විමසන්න.
- කෑම මේසයේ දී ඇති වන සුහද කතා බහක දී තොරතුරු හුවමාරු කරන අයුරු ශිෂ්‍යයන් සමග සාකච්ඡා කරන්න.
- **මූලික වදන්හි** ඇති පද රටා හා වාක්‍ය යෙදුම් ශිෂ්‍යයන්ට හුරු කරවීමට ක්‍රියාකාරකම් සකස් කරන්න. පුහුණුව සඳහා ශිෂ්‍යයින් යොමු කරන්න.
- පාඩමේ ඇති ක්‍රියාකාරකම් හා අභ්‍යාස කරන්න.
- නිවසේ ඇති වන සිද්ධියක් - ශිෂ්‍යයන්ගේ සහභාගිත්වයෙන් චරිතාරෝපිත ව අදහස් ප්‍රකාශ කිරිමට/සරල තොරතුරු පැවසීමට අවස්ථාව ලබා දෙන්න.

**මූලික වදන් :**

| | | | |
|---|---|---|---|
| අම්මා | **හරි රස යි** | **යාපනේ මිදි** | කන්න |
| තාත්තා | **ගුණ යි** | **එක ගෙඩියක්** | කෑවා |
| මම | හොඳ යි | බත් | **ගේනවා** |
| පුතා | | | **ගෙනාවා** |
| | | | **ගෙනල්ලා** |
| | | | **ඉස්සර වෙලා** |

- **පුහුණුව සඳහා යොදා ගන්න.**

අම්මා මිදි ගෙනාවා.
තාත්තා මිදි ගෙනාවා.

අම්මා මිදි ගෙනල්ලා.
තාත්තා මිදි ගෙනල්ලා.

යාපනේ මිදි රස යි.
යාපනේ මිදි ගුණ යි.
යාපනේ මිදි හොඳ යි.

ඉස්සර වෙලා බත් කන්න.
ඉස්සර වෙලා මිදි කන්න.
ඉස්සර වෙලා කෑම කන්න.

මම එක ගෙඩියක් කෑවා.
නංගී එක ගෙඩියක් කෑවා.
මල්ලී එක ගෙඩියක් කෑවා.

**ගුණාත්මක යෙදවුම් :**

- පෙළ පොතේ නියමිත පාඩම
- අවස්ථාව දැක් වෙන පින්තූරයක්
- අදාළ සංවාදය ඇතුළත් හඬ පටයක්

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

**පහත සඳහන් නිර්ණායක යොදා ගන්න.**

- පාඩමේ ඇතුළත් සිද්ධිය/හඳුනා ගෙන ප්‍රකාශ කරයි.
- අදාළ වචන භාවිත කරමින් තොරතුරු හුවමාරු කර ගනියි.
- සරල අවශ්‍යතා ඉටු කර ගැනීමට ඇති භාෂා හැකියාව පිළිබඳ සතුට ප්‍රකාශ කරයි.

## වචන මාලාව

අම්මා - அம்மா

තාත්තා - அப்பா

මම - நான்

පුතා - மகன்

ඉස්සර වෙලා - முன்பாக

යාපනේ මිදි - யாழ்ப்பாண திராட்சை

බත් - சோறு

එක ගෙඩියක් - ஒரு காய்/ஒரு பழம்

හරි රස යි - மிகவும் சுவையானது/நல்லசுவை

ගුණ යි - சத்துள்ளது/போசாக்குள்ளது

හොඳ යි - நன்று

කනවා - சாப்பிடுகிறான்

කන්න - சாப்பிடுங்கள்

කෑවා - சாப்பிட்டார்/சாப்பிட்டேன்

කාලා - சாப்பிடு

ගේනවා - கொண்டுவரல்

ගේන්න - கொண்டுவாருங்கள்

ගෙනාවා - கொண்டு வந்தார்.

ගෙනල්ලා - கொண்டுவந்துள்ளார்

**නිපුණතාව 2.0 :** පොදු සිදු විය හැකි හා කාල්පනික, විවිධ මාතෘකා යටතේ කෙරෙන කතාබස්වලට මැදිහත් වෙමින් ඒවාට ප්‍රතිචාර දක්වමින් සහභාගී ව කටයුතු කරයි.

**නිපුණතා මට්ටම 2.5:** ගනුදෙනුවල දී මැදිහත් වෙයි.

**කාලච්ඡේද :** 04යි.

**ඉගෙනුම් පල :**

- ගනුදෙනුවට අදාළ ව ප්‍රශ්න අසයි.
- ගනුදෙනුවට අදාළ ව තමන්ගේ අදහස් ප්‍රකාශ කරයි.

**පාඩම සැලසුම සඳහා උපදෙස් :**

- නිපුණතා මට්ටමට අදාළ පාඩම තෝරා ගන්න.
- අදාළ පෙළ පොතේ පාඩම ශිෂ්‍ය අවධානයට යොමු කරන්න.
- සියලු ශිෂ්‍යයන් සහභාගි කර ගනිමින් කණ්ඩායම් ක්‍රියාකාරකම් ලෙස ඉදිරිපත් කිරීමට සූදානම් කරන්න.
- සැබෑ අවස්ථාවක්, පටිගත කිරීමක් ශිෂ්‍යයන්ට ඇසීමට සලස්වා ඒ අනුව ගනුදෙනු පිළිබඳ ශිෂ්‍යයන්ට ප්‍රකාශ කිරීමට (**මූලික වදන්** භාවිත කරමින්) අවස්ථාව ලබා දෙන්න.
- වෙළඳ සැලකින් බඩු ගැනීමේ දී භාවිත කරන රටා (පුහුණුව සඳහා ලබා දී ඇති) ශිෂ්‍යයන්ට අවබෝධ කරවීමට උත්සුක වන්න.
- පෙළ පොතෙහි ඇති ක්‍රියාකාරකම් හා අභ්‍යාස කිරිම සඳහා ශිෂ්‍යයන් පොලඹවන්න.
- පුහුණුව සඳහා දී ඇති ක්‍රියාකාරකම් කරන්න.

**මූලික වදන් ඃ**

- **පලතුරු වෙළෙඳ සැලකින් පලතුරු මිල දී ගැනීමක්**

මුදලාලි

| | | |
|---|---|---|
| වට්ටක්කා | එක ගෙඩියක් | කීය ද? |
| වම්බටු | ගෙඩි දෙකක් | කොච්චරක් ද? |
| **කතුරුමුරුංගා** | **ගෙඩි තුනක්** | |
| **දොඩම්** | **කිලෝවක්** | |
| **රඹුටන්** | ග්‍රෑම් පන්සීයක් | |
| **අඹ** | **ගෙඩි 10ක්** | |
| කෙසෙල් ගෙඩි | කිලෝ එකක් 70යි | |
| අන්නාසි | **ගෙඩියක් රුපියල් දහය යි** | |
| පැපොල් | | |
| පේර | | |

- **පුහුණුව සඳහා යොදා ගන්න.**

එක ගෙඩියක්

ගෙඩි දෙකක්

ගෙඩි තුනක්

දොඩම් ගෙඩියක්

දොඩම් ගෙඩි දෙකක්

දොඩම් ගෙඩි තුනක්

මිල කීය ද?

කොච්චරක් ද ?

කිලෝ එකක් කීය ද ?

අඹ ගෙඩියක් කීය ද?

රුපියල් දහය යි.

කෙසෙල් ගෙඩි කීය ද?

කිලෝ එකක් රුපියල් සීය යි.

**ගුණාත්මක යෙදවුම් :**

- පොළකින් පලතුරු මිල දී ගන්නා පින්තූරයක් (වෙළෙන්දෙක්, මවක්, පිරිමි දරුවෙක් හා ගැහැනු දරුවෙක්)
- පෙළ පොතේ නියමිත පාඩම.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

**පහත සඳහන් නිර්ණායක යොදා ගන්න.**

- පොළේ දී භාවිත වචන හඳුනා ගෙන ප්‍රකාශ කරයි.
- අදාළ වචන භාවිත කරමින් කණ්ඩායම් ක්‍රියාකාරකම් (වාචික) සිදු කරයි.
- සරල ගනුදෙනු සිදු කර ගැනීමට භාෂා හැකියාව වර්ධනය කර ගනියි.
- අලුත් වචන ඉගෙනීමට යෝජනා කරයි./කැමැත්ත ප්‍රකාශ කරයි.

වචන මාලාව

මුදලාලි

| | |
|---|---|
| **වට්ටක්කා** | **එක ගෙඩියක්** |
| **වම්බටු** | ගෙඩි දෙකක් |
| **කතුරුමුරුංගා** | **ගෙඩි තුනක්** |
| **දොඩම්** | **කිලෝවක්** |
| **රඹුටන්** | ග්‍රෑම් පන්සීයක් |
| **අඹ** | **ගෙඩි 10ක්** |
| | කිලෝ එකක් 70යි |
| | **කීය ද?** |
| | **කොච්චරක් ද?** |
| | **ගෙඩියක් රුපියල් දහය යි** |

**නිපුණතාව** 2.0 : පොදු සිදු විය හැකි හා කාල්පනික,විවිධ මාතෘකා යටතේ කෙරෙන කතාබස්වලට මැදිහත් වෙමින් ඒවාට ප්‍රතිචාර දක්වමින් සහභාගී ව කටයුතු කරයි.

**නිපුණතා මට්ටම** 2.6 : කෙටි සරල වාචික ප්‍රකාශන ඉදිරිපත් කරයි.

**කාලච්ඡේද** : 03යි.

**ඉගෙනුම් පල** :

- තමා පිළිබඳ තොරතුරු ඉදිරිපත් කරයි.
- සබකෝලයෙන් තොර ව තොරතුරු ඉදිරිපත් කරයි.

**පාඩම සැලසුම සඳහා උපදෙස් :**

- නිපුණතා මට්ටමට අදාළ පාඩම තෝරා ගන්න.
- තමා පිළිබඳ කෙරෙන විස්තරයක් ආදර්ශනය කරන්න.
- පාඩමෙහි ඇති භාෂා අන්තර්ගතය ඉස්මතු කර ගැනිමට ශිෂ්‍යයන් පොලඹවන්න.
- **මූලික** වදන් හි ඇති පද රටා හා භාෂා රටා ඉස්මතු කිරීමට උනන්දු වන්න.
- පාඩමේ ඇති භාෂා භාවිතය ඇසුරෙන් තමා පිළිබඳ තොරතුරු ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- පුහුණුවීම් සඳහා ශිෂ්‍යයින්ගේ අවධානය යොමු කරවන්න.
- පෙළ පොතෙහි ඇති අභ්‍යාස හා ක්‍රියාකාරකම්වල නිරත කරවන්න.

**මූලික වදන් :**

- **තමා පිළිබඳ කෙරෙන කෙටි විස්තරයක්**

| | | | |
|---|---|---|---|
| **මම** | **නම** | **අක්ක කෙනෙක්** | **ඉන්නවා** |
| මගේ | වයස | මල්ලි කෙනෙක් | ඉගෙන ගන්නවා |
| මට | පාසල | එක්ක | එනවා |
| මං | පන්තිය | | |
| අක්කගේ | ගම | | |
| මල්ලිගේ | පවුලේ | | |

- **පුහුණුව සඳහා යොදා ගන්න.**

  මගේ නම කමල්.

  මගේ ගම නුවර.

  මගේ පාසල ගාමිණී මහා විද්‍යාලය.

  මගේ වයස අවුරුදු එකොළහ යි.

  මම හය වැනි පන්තියේ ඉගෙන ගන්නවා.

  මම කැමති යි පොත් කියවන්න./මගේ විනෝදාංශය පොත් කියවීම.

  මගේ අම්මගේ නම සුමනා.

  මගේ තාත්තගේ නම සුනිල්.

  මට අක්ක කෙනෙක් ඉන්නවා.

  මට මල්ලි කෙනෙක් ඉන්නවා.

- **පුහුණුව සඳහා යොදා ගන්න.**

  මගේ නම ...........

  ගම...........

  මට අක්කා කෙනෙක් ඉන්නවා.

  මට මල්ලි කෙනෙක් ඉන්නවා.

  මට අයියා කෙනෙක් ඉන්නවා.

  මට නංගී කෙනෙක් ඉන්නවා.

  මගේ වයස අවුරුදු එකොළහ යි.

  අයියගේ වයස අවුරුදු දාහතර යි.

  නංගිගේ වයස අවුරුදු හය යි.

  මාත් එක්ක අක්ක යි මල්ලි යි පාසලට එනවා.

  මාත් එක්ක නංගි යි මල්ලි යි පාසලට එනවා.

**ගුණාත්මක යෙදවුම්**

- පෙළ පොතේ නියමිත පාඩම

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්**

**පහත සඳහන් නිර්ණායක යොදා ගන්න.**

- තමා හඳුන්වා දීමේ දී භාවිත වචන හඳුනා ගෙන ප්‍රකාශ කරයි.
- සරල වාක්‍ය මගින් තමන් පිළිබඳ විස්තර කරයි.
- තමා පිළිබඳ විස්තර කිරීමට ඇති හැකියාව ගැන සතුට ප්‍රකාශ කරයි.

## වචන මාලාව

| | |
|---|---|
| මම | நான் |
| මගේ | எனது |
| මට | எனக்கு |
| මං | நான் |
| | |
| මල්ලිගේ | தம்பியின் |
| | |
| නම | பெயர் |
| වයස | வயது |
| පාසල | பாடசாலை |
| ගම | கிராமம் |
| පවුලේ | குடும்பத்தில் |
| | |
| එක්ක | உடன் |
| එකොළහයි | பதினொன்று |
| | |
| ඉන්නවා | இருக்கிறார் |
| ඉගෙන ගන්නවා | படிக்கிறார். |
| එනවා | வருகிறார். |

**නිපුණතාව** 3.0 : එදිනෙදා පොදු සිදු විය හැකි හා වෙනත් අවස්ථා ගැන සමීප හා නුහුරු කතාබස්වලින් සැකසුණු විවිධ පාඨ (Texts) අවබෝධයෙන් කියවා ප්‍රතිචාර දක්වමින් ප්‍රධාන තොරතුරු හඳුනා ගනියි. තේරුම් ගනියි.

**නිපුණතා මට්ටම 3.1 :** ලිපි හා වෙනත් ලේඛන කියවයි. නරඹයි.

**කාලච්ඡේද** : 04යි.

**ඉගෙනුම් පල** :

- උපන්දින සුබ පැතුම්වල සඳහන් සරල සුබ පැතීමේ වැකි කියවයි.
- එම වැකිය කිහිප වරක් ශබ්ද නගා කියවයි.
- වෙනත් සුබ පැතීම් කියවයි.

**පාඩම සැලසුම සඳහා උපදෙස් :**

- අදාළ පාඩම තෝරා ගන්න.
- පෙළ කියවා ආදර්ශනය කරන්න.
- පෙළ කියවීමට ශිෂ්‍යයන් යොමු කරන්න.
- තනි තනි ව කියවීමට හැකි වන අන්දමට ක්‍රියාකාරකම්හි යොදවන්න
- සරල වචන, වාක්‍ය කියවීමට සියලු ශිෂ්‍යයන්ට අවස්ථාව ලබා දෙමින් සහාය වන්න.
- උපන්දින සුබ පැතුම් පතක් කියවීමට සියලු ශිෂ්‍යයන්ට අවස්ථාව ලබා දෙන්න.
- පෙළ පොතෙහි කියැවෙන අදහස්/තොරතුරු ශිෂ්‍යයන් සමග සාකච්ඡා කරන්න.
- ප්‍රාර්ථනයක්, සුබ පැතීමක් කිරීමට ශිෂ්‍යයින් හුරු කරවන්න. ඒ සඳහා මූලික වදන් භාවිතයට ගන්න.

**මූලික වදන් ඃ**

- **උපන් දින සුබ පැතීමක්**

| | | |
|---|---|---|
| ඔයා | **සුබ උපන් දිනයක් වේවා!** | ලැබෙනවා. |
| **ඔයාට** | සුබ උපන් දිනයක් ! | පතනවා. |
| යාළුවා | ආයුබෝවන් ! | පත්තු කරනවා. |
| යාළුවෝ | සෙත් වේවා! | එන්න. |
| | ජය වේවා! | කන්න. |
| | බුදු සරණ වේවා! | වාඩි වෙන්න. |
| | නිරෝගී සුව ලැබේවා! | හම්බ වෙනවා. |
| | | මොනවා ද? |

- **පුහුණුව සඳහා යොදා ගන්න.**

1. සුබ උපන් දිනයක් වේවා!
   සෙත් වේවා !
   ජය වේවා!
   බුදු සරණ වේවා!
   ආයුබෝවන්!

2. ඔයාට සුබ උපන් දිනයක් වේවා!
   සුරේස්ට සුබ උපන් දිනයක් වේවා!

3. ඔයාට සුබ පතනවා.
   අපි ඔයාට සුබ පතනවා.

4. තෑගි ගෙනැල්ලා.
   තෑගි ගොඩක් ගෙනැල්ලා.
   ඔයාට ස්තුතියි.
   ඔයාට ගොඩක් ස්තුතියි.



ගුණාත්මක යෙදවුම්:

**ගුණාත්මක යෙදවුම් :**

- විවිධ උපන්දින සුබ පැතුම් පත්
- පෙළ පොතෙහි අදාළ පාඩම

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්:**

**පහත සඳහන් නිර්ණායක යොදා ගන්න.**

- සුබ පැතීමේ දී භාවිත වචන හඳුනා ගෙන ප්‍රකාශ කරයි.
- සරල සුබ පැතුම් සහිත වාක්‍ය කියවයි.
- සරල සුබ පැතීමක් සිදු කරයි.
- සරල සුබ පැතීමක්, ප්‍රාර්ථනයක් කිරීමට කැමැත්ත පළ කරයි.

### වචන මාලාව

| | |
|---|---|
| ඔයා | நீங்கள் |
| ඔයාට | தங்களுக்கு  உங்களுக்கு உமக்கு |
| යාළුවා | நண்பன் |
| යාළුවෝ | நண்பர்கள் |
| සුබ උපන් දිනයක් වේවා! | பிறந்த நாள் வாழ்த்துக்கள் |
| සෙත් වේවා! | நன்மை நடக்கட்டும் |
| බුදු සරණ වේවා! | புத்தபெருமானின் ஆசி கிடைக்கட்டும் |
| ආයුබෝවන් ! | வணக்கம் |
| නිරෝගී සුව ලැබේවා! | நோயற்ற வாழ்வு கிடைக்கட்டும் |
| ලැබෙනවා. | கிடைக்கிறது |
| පතනවා. | வாழ்த்துகிறேன். |
| පත්තු කරනවා. | ஏற்றிவைத்தல். |
| එන්න. | வாருங்கள் |
| කන්න. | சாப்பிடுங்கள் |
| වාඩිවෙන්න. | உட்காருங்கள் |
| මොනව ද? | என்ன? |
| ගෙනල්ලා | கொண்டுவரப்பட்டுள்ளது |
| හුඟක් | அதிகமாக |
| ටිකක් | சிறியளவாக |
| ගොඩක් | அதிகம், நிறைய |

**නිපුණතාව 3.0 :** එදිනෙදා පොදු, සිදුවිය හැකි හා වෙනත් අවස්ථා ගැන සමීප හා නුහුරු කතාබස්වලින් සැකසුණු විවිධ පාඨ (Texts) අවබෝධයෙන් කියවා, ප්‍රතිචාර දක්වමින් ප්‍රධාන තොරතුරු හඳුනා ගනියි.

**නිපුණතා මට්ටම 3.2 :** සාහිත්‍යමය පාඨ කියවයි.

**කාලච්ඡේද :** **03යි**

**ඉගෙනුම් පල :**

- තාල තබමින් ගීතය රස විඳියි.
- සාමූහික ව ගීතය ගායනා කරයි.
- ගීතයේ සරල අදහස තේරුම් ගනියි.
- තනි තනි ව ගීතය ගායනා කරයි.

**පාඩම සැලසුම සඳහා උපදෙස් :**

- පෙළ පොතේ අදාළ පාඩම තෝරා ගන්න.
- එම ගීතය (CD තැටියක් හෝ කැසට් පටයක් ) වාදනය කරවා සවන් දීමට අවස්ථාව ලබා දෙන්න.
- එම ගීතය ශිෂ්‍යයන් සමග ගායනා කරන්න.
- කණ්ඩායම් ගායනයට අවස්ථාව දෙන්න.
- තාල තබමින් ගායනා කිරීමට අවස්ථාව දෙන්න.
- තනි තනි ව (තාල තබමින්) ගායනයට අවස්ථාව දෙන්න.
- අභ්‍යාස හා ක්‍රියාකාරකම් කිරීමට අවස්ථාව දෙන්න.

**මූලික වදන් :**

- හා හා හරි හාවා (ගීතය) - කුමාරතුංග මුනිදාස
- වාක් කෝෂය (ගීතයේ ඇතුළත් වචන හා ඒවායේ තේරුම ශිෂ්‍යයන්ට කියා දීම සුදුසු යි.)

**ගුණාත්මක යෙදවුම් :**

- හා හා හරි හාවා ගීතය(පෙළ පොත)
- ගීතයට අදාළ පින්තූර පෙළක්
- පින්තූරවලට පහළින් (ලොකු අකුරෙන් ලියූ) ගීතයේ කොටස්
- ගීතය ඇතුළත් හඬ පටයක් - (නන්දා මාලිනී)

හා හා හරි හාවා
කැළේ මැදින් ආවා
හිටගෙන ගඟ ගාවා
වට පිට ඇහැ ලෑවා

කොළ දෙකටක් කෑවා
පැන් උගුරක් බීවා
තොලකට ලෙව කෑවා
ඉතින් ඇතැයි කීවා

තබා නිකට ගාවා
වීණාවක් ගෑවා
මිහිරි සින්දු කීවා
නැටුම් ටිකක් පෑවා - **කුමාරතුංග මුනිදාස**

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

**පහත සඳහන් නිර්ණායක යොදා ගන්න.**

- ගීතය නිවැරදි ව ශබ්ද නගා කියවයි.
- සාමූහික ව/තනි ව ම ගීත ගායනා ඉදිරිපත් කරයි.
- ගීත ගායනා කිරීමේ හැකියාව පිළිබඳ සතුට ප්‍රකාශ කරයි.
- ගීත කියවීමට හා ගැයීමට යෝජනා කරයි./කැමැත්ත ප්‍රකාශ කරයි.

**නිපුණතාව** 3.0 : එදිනෙදා පොදු සිදුවිය හැකි හා වෙනත් අවස්ථා ගැන සමීප හා නුහුරු කතාබස්වලින් සැකසුණු විවිධ පාඨ (Texts) අවබෝධයෙන් කියවා ප්‍රතිචාර දක්වමින් ප්‍රධාන තොරතුරු හඳුනා ගනියි. තේරුම් ගනියි.

**නිපුණතා මට්ටම** 3.3 : උපදෙස් කියවයි. නිරීක්ෂණය කරයි.

**කාලච්ඡේද** : 03යි.

**ඉගෙනුම් පල** :

- වඩාත් සරල උපදෙස් කියවයි.
- උපදෙස් කියවා බලා තේරුම් ගෙන ක්‍රියාකරයි.
- උපදෙස් කියවා අන් අයට පහදයි.

**පාඩම සැලසුම සඳහා උපදෙස් :**

- පෙළ පොතේ නිපුණතා මට්ටමට අදාළ පාඩම තෝරා ගන්න.
- එම කොටස ගුරුවරයා ආදර්ශනය කරන්න.
- සියලු ම ශිෂ්‍යයන්ට කියවීමට අවස්ථාවක් ලබා දෙන්න.
- තනි තනි ව කියවීමේ දී ඇති වන ගැටලු නිරාකරණය කර ගැනීමට සහාය වන්න.
- උපදෙස් ලියන ලද උපදෙස් පත්‍රයක් අලවා ඇති බෝතලයක් ශිෂ්‍යයන්ට ලබා දී එය කියවීමට අවස්ථාව දෙන්න.
- උපදෙස් කියවීමේ හැකියාව ඇති කරවීමේ ක්‍රියාකාරකම්හි නිරත කරවන්න.
- විවිධ උපදෙස් නිදසුන් ලෙස ගෙන කියවීමට අවස්ථා ලබා දෙන්න.

  උදා :

  මෙහි දැන්වීම් අලවන්න එපා
  පා පුවරුවේ යාම තහනම්
  මාරු කාසි රැගෙන එන්න
  වාහන නතර කිරීම තහනම්
  කුණු දැමීම තහනම්

**මූලික වදන් :**

- **බෙහෙත් පාවිච්චි කිරීමට උපදෙස් කියවීම.**

| | | | |
|---|---|---|---|
| **බෙහෙත්** | නැගිටින්න. | දූන් | දවසට |
| **බෝතලය** | **බොන්න.** | **තව** | **තුන් සැරයක්** |
| **මේස හැඳි** | **සොලවන්න.** | එහෙනම් | **හැඳි දෙකක්** |
| **මූඩිය** | **වහන්න.** | **හොඳින්** | |
| සිසිල් තැනක | **තියන්න.** | හොඳට | |
| | සනීප ද? | නෑ | |
| | බිව්වා ද? | ඉස්සර වෙලා | |

**ගුණාත්මක යෙදවුම් :**

- වෛද්‍යවරයෙකු හා රෝගියෙකු අතර සිදු වන දෙබසක් (පින්තූර සහිත)
- පෙළ පොතෙහි පාඩම
- බෙහෙත් පාවිච්චි කිරීම සඳහා දෙන ලද උපදෙස් පත්‍රිකාවක්

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

**පහත සඳහන් නිර්ණායක යොදා ගන්න.**

- සරල උපදෙස් සහිත වාක්‍ය කියවයි.
- උපදෙස් සහිත වාක්‍ය කියවා තේරුම් ගෙන ප්‍රතිචාර දක්වයි.
- උපදෙස් කියවා තේරුම් ගැනීමට ඇති හැකියාව පිළිබඳ සතුට ප්‍රකාශ කරයි.
- විවිධ උපදෙස් කියවීමට යෝජනා කරයි/කැමැත්ත ප්‍රකාශ කරයි.

වචන මාලාව

| | | |
|---|---|---|
| පුතා | - | மகன் |
| බෙහෙත් | - | மருந்து |
| මේස හැඳි | - | மேசைக்கரண்டி |
| මූඩිය | - | மூடி |
| සිසිල් තැනක | - | குளிர்மையான இடத்தில் |
| දැන් | - | இப்பொழுது |
| තව | - | இன்னும் |
| එහෙනම් | - | அப்படியானால் |
| හොඳින් | - | நன்றாக |
| හොඳට | - | நன்றாக |
| නැගිටින්න | - | எழும்புங்கள் |
| වහන්න | - | மூடுங்கள் |
| කියන්න | - | சொல்லுங்கள் |
| නෑ | - | இல்லை |
| ඉස්සර වෙලා | - | முன்பதாக |
| දවසට | - | ஒரு நாளைக்கு |
| බිව්වා ද? | - | குடித்தீர்களா? |
| තුන් සැරයක් | - | மூன்று தடவை |
| හැඳි දෙකක් | - | இரண்டு கரண்டிகள் |
| සනීප ද? | - | சுகமா? |

**නිපුණතාව 3.0 :** එදිනෙදා පොදු සිදුවිය හැකි හා වෙනත් අවස්ථා ගැන සමීප හා නුහුරු කතාබස්වලින් සැකසුණු විවිධ පාඨ (Texts) අවබෝධයෙන් කියවා ප්‍රතිචාර දක්වමින් ප්‍රධාන තොරතුරු හඳුනා ගනියි. තේරුම් ගනියි.

**නිපුණතා මට්ටම 3.4 :** ශ්‍රව්‍ය දෘශ්‍ය පාඨ හා වෙනත් මාධ්‍ය තොරතුරු කියවයි. නිරීක්ෂණය කරයි.

**කාලච්ඡේද :** 03යි.

**ඉගෙනුම් පල :**

- කතන්දරයක රූප බලා ඒවාට අදාළ වැකි කියවයි.
- නිවැරදි හඬ පාලනයෙන් යුතු ව කියවයි.
- එවැනි තවත් සරල ළමා කතන්දර කියවයි.

**පාඩම සැලසුම සඳහා උපදෙස් :**

- නිපුණතා මට්ටමට අදාළ **පිපාසිත කපුටා** පාඩම තෝරා ගන්න.
- පාඩමෙහි ඇති පින්තූර කතාව ශිෂ්‍යයන්ට ප්‍රදර්ශනය කරන්න.
- නියමිත කොටස් කියවීමෙන් ආදර්ශනය කරන්න.
- පින්තූරයට අදාළ කතා කොටස කියවීමට යොමු කරන්න.
- සියලු ම ශිෂ්‍යයන්ගේ සහභාගිත්වය ලබා ගන්න.
- ශිෂ්‍යයන්ට සමස්ත පාඩම කියවීමට අවස්ථාව ලබා දෙන්න.
- පාඩමෙහි ඇති අවස්ථා හා සිද්ධි ඉස්මතු කර සාකච්ඡා කරන්න.
- **මූලික වදන්හි** ඇති වචන, පද රටා අභ්‍යාස සඳහා යොදා ගන්න.
- පාඩමේ ඇති ක්‍රියාකාරකම් හා අභ්‍යාස කරවන්න.

මූලික වදන් ඃ

- **පිපාසිත කපුටා කතන්දරය.**

| | | | | |
|---|---|---|---|---|
| **කපුටා** | **කළය** | තිබහා | තියෙනවා. | **පස්සේ** |
| **උඟ** | වතුර | සතුටින් | **හෙව්වා.** | **ඊට පස්සේ** |
| හොට | **ගල් කැට** | | **දැක්කා.** | ඒ වුණාට |
| | උපායක් | | වැහුවා. | **ටික ටික** |
| | අඩියේ | | උත්සහ කළා. | ටිකක් |
| | උඩ | | කල්පනා කෙරුවා. | |
| | | | යෙදුවා. | |
| | | | දිග මදි | |

ගුණාත්මක යෙදවුම් ඃ

- පිපාසිත කපුටාගේ කතාව දැක්වෙන පින්තූර
- පෙළ පොතෙහි පාඩම

ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් ඃ

**පහත සඳහන් නිර්ණායක යොදා ගන්න.**

- රූප / පින්තූර බලා ඒවාට අදාළ වැකි කියවයි.
- සරල කතන්දරයක් කියවයි.
- සරල කතන්දරයක් කියවීමට හැකිවීම පිළිබඳ සතුටු වෙයි.
- වෙනත් සරල කතන්දර කියවීමට කැමැත්ත ප්‍රකාශ කරයි.

## වචන මාලාව

කපුටා/කාක්කා - காகம்

ඌ - அது

හොට - சொண்டு

කළය - குடம்

වතුර - தண்ணீர்

ගල්කැට - கற்கள்

උපායක් - உபாயத்தை/தந்திரத்தை

අඩියේ - அடியில்

උඩ - மேல்

උඩට - மேலே

තිබහ - தாகம்

සතුටින් - சந்தோ‘ மாக

හෙව්වා - தேடியது

තියෙනවා - உண்டு/இருக்கிறது

දැක්කා - கண்டது

වැහුවා மூடியது

උත්සාහ කළා - முயற்சி செய்தார்

කල්පනා කෙරුවා- யோசித்து

යෙදුවා - பிரயோகித்து

පස්සේ - பின்பு

ඊට පස්සේ - அதற்குப் பின்பு

ඒ වුණාට - இருந்தாலும்

ටික ටික - சிறியளவு/கொஞ்சம்

ටිකක් - கொஞ்சம்

# ලිවීම

**නිපුණතාව** 4.0 : පොදු සිදු විය හැකි සහ කාල්පනික අවස්ථා ගැන සුපුරුදු සහ නුහුරු භාෂා රටාවක් සහිත නොයෙක් ආකාර කෙටි සරල ලිපි ලේඛන ලියයි.

**නිපුණතා මට්ටම** 4.1 : විස්තර පාඨ ලියයි.

**කාලච්ඡේද** : 04යි.

**ඉගෙනුම් පල** :

- සරල අකුරු ලියයි.
- පිල්ලම් සහිත අකුරු ලියයි.
- සරල අකුරු හා පිල්ලම් සහිත (අකුරු දෙකේ සහ තුනේ) වචන ලියයි.

**පාඩම සැලසුම සඳහා උපදෙස්** :

- තිත් ඉරි යා කරමින් අකුරු ලියවන්න.
- පළමු ව ඉතා සරල ව ලිවිය හැකි අකුරු ලියවන්න.
- හඳුනා ගත් සරල අකුරු භාවිත කරමින් වචන ගොඩනගන්නට හුරු කරන්න. (අකුරු දෙකේ තුනේ වචන)
- පිලි භාවිත කරමින් අකුරු (සරල අකුරු) ලිවීමට හුරු කරවන්න.
- දිශාව, හැඩය, ප්‍රමාණය සලකා රූල් මත ලිවීමට හුරු කරවන්න.
- අකුරු ලිවීමේ හුරුව ලබා ගැනීම සඳහා දිනපතා පැවරුම් ලබා දෙන්න.
- අභ්‍යාස හා ක්‍රියාකාරකම් කිරීමට ශිෂ්‍යයන්ට සහාය වන්න.
- **මූලික වදන්හි** ඇති අකුරු ලිවීමට හුරු කරවන්න.

**මූලික වදන්** :

- අකුරු ලිවීම

ර, ඊ, උ, ඌ, ද, ඳ

අ, ආ, ඇ, ඈ, අං

ට, ව, ච, ඨ, ඵ, ළු, ඒ, ධ, ඩ, ඪ

ග, හ, ශ,

ම, ඹ, ෆ, ඛ, ධ

ප, ජ, ඡ

න, ත, ක

ය, ස, ග

**ගුණාත්මක යෙදවුම් :**

- පෙළ පොත
- අකුරු/වචන කාඩ්පත්
- අකුරු රූල් මත ලියා සකස් කරන ලද ප්‍රදර්ශන පුවරුවක්

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

**පහත සඳහන් නිර්ණායක යොදා ගන්න.**

- සරල අකුරු නිවැරදි ව ලියයි.
- පිල්ලම් යොදා නිවැරදි ව අකුරු ලියයි.
- සරල වචන නිවැරදි ව ලියයි.
- අකුර ලිවීමේ කුසලතාව පිළිබඳ සතුට ප්‍රකාශ කරයි.
- වෙනත් වචන ලිවීමට කැමැත්ත ප්‍රකාශ කරයි.

.

**නිපුණතාව 4.0 :** පොදු සිදු විය හැකි සහ කාල්පනික අවස්ථා ගැන සුපුරුදු සහ නුහුරු භාෂා රටාවක් සහිත නොයෙක් ආකාර කෙටි, සරල ලිපි ලේඛන ලියයි.

**නිපුණතා මට්ටම 4.2 :** නිර්මාණාත්මක පාඨ ලියයි.

**කාලච්ඡේද :** **04යි.**

**ඉගෙනුම් පල :**

- සරල වාක්‍ය ලිවීමේ හුරුව ලබයි.
- සරල වාක්‍ය ලියයි.

**පාඩම සැලසුම සඳහා උපදෙස් :**

- පෙළ පොතෙහි පාඩම් ඇසුරෙන් සරල වගන්ති ලිවීමට සිසුන්ට උදව් කරන්න.
- වාක්‍ය ලිවීම හුරු කිරීම සඳහා ආදර්ශ වාක්‍ය/වගන්ති කිහිපයක් ලබා දෙන්න.
- ආදර්ශයට අනුව කෙටි, සරල වාක්‍ය හෝ වගන්ති හෝ ලිවීමට අවස්ථාව ලබා දෙන්න.
- සරල මාතෘකා යටතේ සරල වාක්‍ය ලිවීමට හුරු කරවන්න.
- පෙළ පොතෙහි පාඩම්වලට අදාළ ක්‍රියාකාරකම් හා අභ්‍යාස කිරීමට ශිෂ්‍යයන් යොමු කරවන්න.

**මූලික වදන් :**

- **තමා ගැන විස්තර ලිවීම**

  මගේ නම-------

  මගේ පාසල--------

  මගේ ගම-------

- **නිවසේ පරිසරය ඇසුරෙන් සරල වාක්‍ය ලිවීම :**

  තාත්තා එනවා

  අම්මා එනවා

  මල්ලී යනවා

  පොත තියෙනවා

  පූසා ඉන්නවා

**ගුණාත්මක යෙදවුම් :**

- පෙළ පොතෙහි අදාළ පාඩම
- ආදර්ශ වාක්‍ය ඇළත් පත්‍රිකා
- හිස්තැන් පිරවීම සඳහා සැකසූ පත්‍රිකා

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

**පහත සඳහන් නිර්ණායක යොදා ගන්න.**

- සරල වාක්‍ය නිවැරදි ව පිටපත් කරයි.
- සරල වාක්‍ය නිර්මාණය කර ලියයි.
- ලිවීමේ කුසලතාව පිළිබඳ ව සතුට ප්‍රකාශ කරයි.

# පාසල පදනම් කරගත් ඇගයීම් වැඩ පිළිවෙළ

**කුසලතාව** : සවන් දීම

**ශ්‍රේණිය** : 6

**වාරය** : 01

**උපකරණ අංකය** : 01

**නිපුණතා මට්ටම** : 1.2

**හැඳින්වීම** : මෙම ඇගයීම් උපකරණ මගින් උපදෙස්වලට අවධානයෙන් යුතු ව සවන් දී ප්‍රතිචාර දැක්වීමේ හැකියාව ඇගයීමට ලක් කෙරේ.

1 **මනිනු ලබන හැකියාව** : අවධානයෙන් සවන් දීම

2 **චර්යාමය අරමුණු** : සවන් දී එහි ඇතුළත් උපදෙස් අවබෝධයෙන් ක්‍රියාත්මක කිරීම

3 **ඇගයීම් ප්‍රභේදය** : උපදෙස් ඇතුළත් ප්‍රකාශයක්

4 **ක්‍රියාකාරකම සඳහා ගුරුවරයාට උදව්:**

- නිවසේ උදෑසන පාසල් යාමට සූදානම් වන මොහොතක ලබා දෙන සරල උපදෙස් සඳහා මෙහි ඇති පෙළ පොතේ 1.2 නිපුණතාවට අදාළ පාඩම යොදා ගන්න. එම උපදෙස් ශිෂ්‍යයන්ට අසන්නට සලස්වන්න.
- එය කිහිපවරක් ඇසීමට සලස්වන්න.
- එම උපදෙස්වල ස්වභාවය/රටාව හඳුනා ගැනීමට/මතු කර ගැනීමට සිසුන්ට උදවු කරන්න.
- උපදෙස් සහිත වගන්ති අනුකරණය කිරීමට සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.
- ශිෂ්‍යයන් ක්‍රියාකාරකමේ යොදවන්න.
- තනි තනි ව ශිෂ්‍යයන් අගයන්න.

**සිසු ක්‍රියාකාරකම:**

- උපදෙස්වලට අවධානයෙන් සවන් දීම
- උපදෙස් ලබාදෙන වගන්ති රටාව අනුකරණය කිරීම

## ඇගයීම් නිර්ණායක

| නිර්ණායක / ශිෂ්‍යයන්ගේ නම් | ඇසූ යමක් කියයි (ලකුණු 4) | සවන් දුන් උපදේශයක් මතකයෙන් කියයි (ලකුණු 4) | සවන්දුන් උපදේශ 2ක් මතකයෙන් කියයි (ලකුණු 4) | උපදේශ කිහිපයක් අනුකරණය කරයි (ලකුණු 4) | උපදේශ 2 ක් අවස්ථානුකූල ව අනුකරණය කරයි (ලකුණු 4) |
|---|---|---|---|---|---|
| | | | | | |
| | | | | | |
| | | | | | |
| | | | | | |
| | | | | | |
| | | | | | |
| | | | | | |
| | | | | | |
| | | | | | |
| | | | | | |

### ලකුණු ප්‍රදානය

| ලකුණු ලබා දෙන පිළිවෙළ | ලකුණු |
|---|---|
| ඉහළ ප්‍රවීණතාවට පැමිණ ඇත. | 04 |
| ප්‍රවීණතාවට පැමිණ ඇත. | 03 |
| ප්‍රවීණතාවට ආසන්න වී ඇත. | 02 |
| ප්‍රවීණතාවට ළඟා විය යුතු ව ඇත. | 01 |

## පාසල පදනම් කරගත් ඇගයීම් වැඩ පිළිවෙළ

**කුසලතාව** : සවන් දීම

**ශ්‍රේණිය** : 6

වාරය : 01

**උපකරණ අංකය** : 01

**නිපුණතා මට්ටම** : 2.2

**හැඳින්වීම** : මෙම ඇගයීම් උපකරණයෙන් සුහද සංවාදවල දී මැදිහත් වෙමින් ප්‍රතිචාර දැක්වීමේ හැකියාව ඇගයීමට ලක් කෙරේ.

1 **මනිනු ලබන හැකියාව** : සුහදශීලී ව කතාබහ කිරීම

2 **චර්යාමය අරමුණු** : අවස්ථානුකූල ව ප්‍රතිචාර දැක්වීම

3 **ඇගයීම් ප්‍රභේදය** : සංවාද

4 **ක්‍රියාකාරකම සඳහා ගුරුවරයාට උදව්:**

- නිපුණතාවට අදාළ (2.2) පෙළ පොතේ පාඩම ශිෂ්‍යයන්ට සවන් දීමට සලස්වන්න.
- එය කිහිපවරක් ඇසීමට සලස්වන්න.
- සංවාදයේ ඇතුළත් වචන/පද රටා පිළිබඳ ශිෂ්‍යයන්ගෙන් විමසන්න.
- පාසලට යාමට සූදානම් වීමේ දී තමාට සිදු වූ අහඹු සිදුවීමක් ඉතා කෙටියෙන් පැවසීමට සලස්වන්න.
- තනි තනි ව ශිෂ්‍යයන් අගයන්න.

**සිසු ක්‍රියාකාරකම:**

- සුහද සංවාදයට අවධානයෙන් සවන් දීම
- සංවාදයේ ඇතුළත් වචන මතකයෙන් ප්‍රකාශ කිරීම.
- සංවාදයේ වචන අනුකරණය කිරීම.
- තමා මුහුණ දුන් අහඹු සිදුවීමක ඉතා කෙටියෙන් ප්‍රකාශ කිරීම

## 5 ඇගයීම් නිර්ණායක :

| නිර්ණායක / ශිෂ්‍යයන්ගේ නම් | ඇසූ යමක් කියයි (ලකුණු 4) | පද රටා 4 ක් කියයි. (ලකුණු 4) | පද රටා සහිත වගන්ති 2 ක් කියයි. (ලකුණු 4) | සවන් දි පද රටා සහිත වගන්ති කිහිපයක් අනුකරණය කරයි. (ලකුණු 4) | සවන් දී පද රටා සහිත වගන්ති දෙකක් අවස්ථානුකූල ව අනුකරණය කරයි. (ලකුණු 4) |
|---|---|---|---|---|---|
| | | | | | |
| | | | | | |
| | | | | | |
| | | | | | |
| | | | | | |
| | | | | | |
| | | | | | |
| | | | | | |
| | | | | | |
| | | | | | |

### ලකුණු ප්‍රදානය

| **ලකුණු ලබා දෙන පිළිවෙළ** | **ලකුණු** |
|---|---|
| ඉහළ ප්‍රවීණතාවට පැමිණ ඇත. | 04 |
| ප්‍රවීණතාවට පැමිණ ඇත. | 03 |
| ප්‍රවීණතාවට ආසන්න වී ඇත. | 02 |
| ප්‍රවීණතාවට ළඟා විය යුතු ව ඇත. | 01 |

# පාසල පදනම් කරගත් ඇගයීම් වැඩ පිළිවෙළ

| | | |
|---|---|---|
| කුසලතාව | : | කථනය |
| ශ්‍රේණිය | : | 6 |
| වාරය | : | 02 |
| උපකරණ අංකය | : | 02 |
| නිපුණතා මට්ටම | : | 2.2 |
| හැඳින්වීම | : | මෙම ඇගයීම් උපකරණයෙන් සුහද සංවාදවල දී මැදිහත් වෙමින් ප්‍රතිචාර දක්වීමේ හැකියාව ඇගයීමට ලක් කෙරේ. |

1 **මනිනු ලබන හැකියාව** : සුහදශීලී ව කතාබහ කිරීම.

2 **චර්යාමය අරමුණු** : අවස්ථානුකූල ව ප්‍රතිචාර දක්වීම.

3 **ඇගයීම් ප්‍රභේදය** : සංවාද

4 **ක්‍රියාකාරකම සඳහා**

ගුරුවරයාට උදව් :

- නිපුණතාවට අදාළ (2.2) පෙළ පොතේ පාඩම ශිෂ්‍යයන්ට සවන් දීමට සලස්වන්න.
- එය කිහිපවරක් ඇසීමට සලස්වන්න.
- සංවාදයේ ඇතුළත් වචන/පද රටා පිළිබඳ ශිෂ්‍යයන්ගෙන් විමසන්න.
- පාසලට යාමට සූදානම් වීමේ දී තමාට සිදු වූ අහඹු සිදුවීමක් ඉතා කෙටියෙන් පැවසීමට සලස්වන්න. (එක වාක්‍යයක් වුවද ප්‍රමාණවත්ය.)
- තනි තනි ව ශිෂ්‍යයන් අගයන්න.

**සිසු ක්‍රියාකාරකම:**

- සුහද සංවාදයට අවධානයෙන් සවන් දීම
- සංවාදයේ ඇතුළත් වචන මතකයෙන් ප්‍රකාශ කිරීම
- සංවාදයේ වචන අනුකරණය කිරීම
- තමා මුහුණ දුන් අහඹු සිදුවීමක් ඉතා කෙටියෙන් ප්‍රකාශ කිරීම

## 5. ඇගයීම් නිර්ණායක :

| නිර්ණායක / ශිෂ්‍යයන්ගේ නම් | තමා පිළිබඳ කතා කිරීමට ඉදිරිපත් වෙයි (ලකුණු 4) | තමාගේ නම සහ ගම ප්‍රකාශ කරයි (ලකුණු 4) | තමාගේ පන්තිය පාසල ප්‍රකාශ කරයි (ලකුණු 4) | තමාගේ මවගේ නම පියාගේ නම පවුලේ සිටින අයගේ කෙටි විස්තරයක් කරයි (ලකුණු 4) | තමා පිළිබඳ සරල විස්තරයක් (1,2,3,4 නිර්ණායකවල ඇතුළත් තොරතුරු සහිතව ප්‍රකාශ කරයි) (ලකුණු 4) |
|---|---|---|---|---|---|
| | | | | | |
| | | | | | |
| | | | | | |
| | | | | | |
| | | | | | |
| | | | | | |
| | | | | | |
| | | | | | |
| | | | | | |
| | | | | | |

### ලකුණු ප්‍රදානය

| ලකුණු ලබා දෙන පිළිවෙළ | ලකුණු |
|---|---|
| ඉහළ ප්‍රවීණතාවට පැමිණ ඇත. | 04 |
| ප්‍රවීණතාවට පැමිණ ඇත. | 03 |
| ප්‍රවීණතාවට ආසන්න වී ඇත. | 02 |
| ප්‍රවීණතාවට ළඟා විය යුතු ව ඇත. | 01 |

# පාසල පදනම් කරගත් ඇගයීම් වැඩ පිළිවෙළ

**කුසලතාව** : කථනය

**ශ්‍රේණිය** : 6

**වාරය** : 03

**උපකරණ අංකය** : 03

**නිපුණතා මට්ටම** : 2.7

**හැඳින්වීම** : මෙම ඇගයීම් උපකරණයෙන් තමා පිළිබඳ කෙටි විස්තරයක් කිරීමේ හැකියාව ඇගයීමට ලක් කෙරේ.

1 **මනිනු ලබන හැකියාව** : විස්තර කිරීමේ හැකියාව.

2 **චර්යාමය අරමුණු** : අන්‍යයන්ට තමා හඳුන්වා දීම

3 **ඇගයීම් ප්‍රභේදය** : විස්තර ප්‍රකාශයක්

4 **ක්‍රියාකාරකම සඳහා ගුරුවරයාට උදව්:**

- ගුරුවරයා විසින් තමා පිළිබඳ කෙටි විස්තරයක් සිදු කරන්න.
- කිහිප වරක් තමා පිළිබඳ හඳුන්වා දෙන්න.
- තනි තනි ව තමා පිළිබඳ විස්තරයක් ඉදිරිපත් කිරීමට ශිෂ්‍යයන්ට අවස්ථාව ලබා දෙන්න.

**සිසු ක්‍රියාකාරකම් :**

- ගුරුවරයා තමා පිළිබඳ කරන විස්තරයට අවධානයෙන් සවන් දීම
- තමා පිළිබඳ සරල වාක්‍ය කිහිපයක් කීමට සූදානම් වීම

## 5 ඇගයීම් නිර්ණායක

| නිර්ණායක / ශිෂ්‍යයන්ගේ නම් | සංවාදයේ වචන කිහිපයක් කියයි (ලකුණු 4) | සංවාදයේ අහඹු සිදුවීම තමන් දන්නා වචනවලින් කියයි (ලකුණු 4) | සංවාදයේ වචන රටා අනුකරණය කරයි (ලකුණු 4) | තමා මුහුණ දුන් අහඹු සිදුවීමක් පිළිබඳ කෙටි වාක්‍යයකින් කියයි (ලකුණු 4) | තමා මුහුණ දුන් අහඹු සිදුවීම පිළිබඳ අර්ථවත් වාක්‍ය කිහිපයක් කියයි (ලකුණු 4) |
|---|---|---|---|---|---|
| | | | | | |
| | | | | | |
| | | | | | |
| | | | | | |
| | | | | | |
| | | | | | |
| | | | | | |
| | | | | | |
| | | | | | |
| | | | | | |

**ලකුණු ප්‍රදානය**

| **ලකුණු ලබා දෙන පිළිවෙළ** | **ලකුණු** |
|---|---|
| ඉහළ ප්‍රවීණතාවට පැමිණ ඇත. | 04 |
| ප්‍රවීණතාවට පැමිණ ඇත. | 03 |
| ප්‍රවීණතාවට ආසන්න වී ඇත. | 02 |
| ප්‍රවීණතාවට ළඟා විය යුතු ව ඇත. | 01 |

# සිංහල වර්ණමාලාව

